# ජාතික අයවැය 2024

කුමක් සඳහා ද, කා වෙනුවෙන් ද

මුදල්, ආර්ථික ස්ථායීකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# ජාතික අයවැය 2024

කුමක් සඳහා ද , කා වෙනුවෙන්ද

2023 නොවැම්බර්

# ජාතික අයවැය 2024 කුමක් සඳහා ද , කා වෙනුවෙන්ද ?

## එය 2024 සඳහා වන අයවැය ඇස්තමේන්තුවේ සරල සංස්කරණයකි





වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයකි (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 - 152 වගන්තිය). 2024 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට, 2024 වර්ෂය තුළ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන සඳහා වියදම් සීමාවන් සමඟ මෙම වියදම් සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ යෝජිත මාධ්‍යයන් ඇතුළත් වන අතර එය ඉදිරිපත් කර ඇති ගිණුම්කරන ආකෘතිය සාමාන්‍ය ජනතාව වෙත සංකීර්ණ බවක් පෙන්නුම් කරයි.

එබැවින්, රාජ්‍ය අයවැයේ අන්තර්ගත තොරතුරු වඩාත් සරලව හා අඩු පාරිභාෂික බවකින් යුතුව බෙදා හැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදහස් කර ඇත. මෙම ප්‍රයත්නය තුළින් සිවිල් සමාජය හට රජයේ ප්‍රමුඛතා අවබෝධ කර ගත හැකි වනු ඇති අතර සම්පත් වෙන් කිරීම සහ එය කාර්යක්ෂමව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමට මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.


අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වැය දරන අයතන ප්‍රධානීන් විසින් ලබා දෙන ලද ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම වෙනුවට, මෙම ප්‍රකාශනය මඟින් ප්‍රධාන වශයෙන් අංශ අනුව ප්‍රධාන ව්‍යාපෘති / වැඩසටහන් සඳහා රජයේ වියදම් පිළිබඳ තොරතුරු සැකෙවින් සපයනු ලැබේ. තවද, ණය සේවා සහ හදිසි සේවා සඳහා වන ප්‍රතිපාදන මෙම අංශ යටතේ නොසැලකේ. **පහසු පරිශීලනය සඳහා, ආංශික එකතුවෙහි රුපියල් සංඛ්‍යා ආසන්නතම බිලියනය දක්වා වටයා ඇති අතර එම නිසා, ගිණුම්කරණ ආකෘතියේ සංඛ්‍යා සමඟ සැසඳීමේ දී සුළු විෂමතා ඇති විය හැක. තවද, අයවැය කතාවෙන් පසුව, මෙම ලේඛනය අයවැය යෝජනා ද ඇතුළත්ව යාවත්කාලීන කරනු ලැබේ.**



# 2048 වසර දක්වා සංවර්ධන මාවත

‘ නිදහසින් වසර 100 සපිරෙන 2048 වසර වෙද්දි සංවර්ධිත රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කරලීමේ අලුත් ප්‍රවේශයට හා අලුත් වැඩපිළිවෙලට පසුබිම මේ අයවැය යෝජනා මඟින් සකස් කෙරෙනවා ’

**2023 අයවැය කතාව 3.30 ඡේදය**






**2048**

දියුණු ආර්ථිකයක්

......

**2025**

- ද. දේ. නි. යෙන් 2.3% ට වැඩි ප්‍රාථමික අතිරික්තයක්
- ද. දේ. නි. යෙන් 15% ක රාජ්‍ය ආදායමක්

......

**2032**

ඩිජිටල්කරණය වූ, පරිසර හිතකාමී මෙන්ම සමාජ සාධාරණත්වයෙන් යුතු හා අතිශයින්ම තරඟකාරී අපනයන ආර්ථිකයක්

**මධ්‍යකාලීනව අපේක්ෂා කෙරෙනුයේ,**

2022 අවසන් වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 128 ක් පමණ වූ රාජ්‍ය අංශයේ ණය 2032 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95 කට වඩා අඩු අගයකට අඩු කිරීම

උද්ධමනය මධ්‍ය-තනි ඉලක්කමක පවත්වා ගෙන යාම

විදේශ විනිමය සංචිත ප්‍රතිස්ථාපනය කිරීම

5% කට වැඩි මධ්‍ය කාලීන ආර්ථික වර්ධනයක් අත්කරගැනීම

# අයවැය සාරාංශය - 2024

රු.බි

| | 2024<br>ඇස්ත. |
|---|---|
| **ආදායම** | 4,181 |
| බදු ආදායම | 3,820 |
| බදු නොවන ආදායම | 341 |
| ප්‍රදාන | 20 |
| **පුනරාවර්තන වියදම** | 7,827 |
| ප්‍රාථමික වියදම | 5,176 |
| පුනරාවර්තන | 3,971 |
| ප්‍රාග්ධන | 1,205 |
| **පොළී ගෙවීම්** | 2,651 |

ප්‍රාථමික වියදම් යනු පොලී ගෙවීම් සඳහා වන වියදම් හැර රජයේ වියදම් ය

** 2024 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත අනුව සකස් කර ඇත*


# 2024 වර්ෂය තුළ රජයට ආදායම් ලැබෙන ආකාරය

රු.බි

| **ආදායම් කාණ්ඩය** | **2024-ඇස්තමේන්තු** |
|---|---|
| ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 508 |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2,216 |
| බලපත්‍ර ගාස්තු සහ වෙනත් | 16 |
| ආදායම සහ ලාභ මත බදු | 1,080 |
| බදු නොවන ආදායම | 341 |
| ප්‍රදානයන් | 20 |
| එකතුව | 4,181 |

** 2024 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත අනුව සකස් කර ඇත*

# 2024 සඳහා අපේක්ෂිත රජයේ ආදායම - රු. බිලියන





# 2024 වර්ෂය තුළ රජය විසින් වියදම් කරනු ලබන ආකාරය

| කාණ්ඩය | 2024 වියදම. (රු.බි.) ඇස්ත. | 2024 වසරේ මුළු වියදමෙන් %ක් ලෙස |
|---|---|---|
| පොළී ගෙවීම් | 2,651 | 34 |
| ණය මුදලේ ආපසු ගෙවන කොටස | 1,268 | 16 |
| ප්‍රාග්ධනය | 1,205 | 15 |
| වැටුප් | 1,107 | 14 |
| විශ්‍රාම වැටුප් | 386 | 5 |
| වෙනත් පුනරාවර්තන | 1,210 | 16 |
| එකතුව | 7,827 | 100 |


** 2024 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත අනුව සකස් කර ඇත*

## 2024 වර්ෂය තුළ රජය විසින් වියදම් කරනු ලබන ආකාරය




# 2012-2022 කාලවකවානුව තුළ රජය විසින් වියදම් දරන ලද ආකාරය (ද.දේ.නි.යෙන් % ක් ලෙස)

## රජයේ ආදායම් සහ වියදම්



# හඳුන්වා දෙන ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ

## වැඩිදියුණු කරන ලද ආදායම් කළමනාකරණය

- එකතු කළ අගය මත බදු 8% සිට 18% දක්වා ක්‍රමිකව වැඩි කිරීම
- නව සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් හඳුන්වාදීම
- එකතු කළ අගය මත බදු සීමාව සහ නිදහස් කිරීම් අඩු කිරීම
- ආයතනික සහ පුද්ගලික ආදායම් බදු වලට අදාළ වෙනස්කම්
- RAMIS ඇතුළු බදු පරිපාලනය ඩිජිටල්කරණය
- ක්‍රම සහ විධි පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව ස්ථාපිත කිරීම

**මෙම ප්‍රතිසංස්කරණ මගින් බොහෝ අංශ ආවරණය වන අතර ආර්ථික ස්ථාවරත්වය මෙන්ම අර්බුදයේ සමාජයීය බලපෑම් වලට විසඳුම් ලබා දීමට අපේක්ෂා කෙරේ.**

## වැඩිදියුණු කරන ලද වියදම්, ණය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය

- දැඩි චක්‍රලේඛ උපදෙස් ඇතුළු වියදම් පාලනය සහ තාර්කිකකරණ පියවර
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාමගැනීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීම
- තෝරාගත් අරමුණු සඳහා රජයේ සේවකයන්ට වසර 5ක වැටුප් රහිත නිවාඩු ලබා දීම
- ත්‍රිවිධ හමුදාවේ තෝරාගත් නිලධාරීන්ට කලින් විශ්‍රාම යාමට ඉඩ සැලසීම
- රාජ්‍ය සේවයේ සියලු අංශ සමාලෝචනය කරමින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඇතුළු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති කොමිසමක් පත්කිරීම
- පාර්ලිමේන්තු අයවැය ආධාරක කාර්යාලයක් පිහිටුවීම
- ජාතික ණය කළමනාකරණ කාර්යාංශය ස්ථාපිත කිරීම
- රාජ්‍ය මූල්‍ය රීති සමඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත හඳුන්වා දීම
- වියදම් කළමනාකරණයට අදාළව ඩිජිටල්කරණය වැඩි කිරීම (ITMIS)
- යහපාලනය ශක්තිමත් කිරීම සහ දූෂණයට එරෙහිව සටන් කිරීම
- රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවක් පිහිටුවීම (PERC)

# මිලකරණ/ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

- ඉන්ධන, විදුලිය සහ LP ගෑස් සඳහා පිරිවැය ආවරණය වන මිල ක්‍රමයක් හඳුන්වා දීම
- මුදල් අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ඒකකය පිහිටුවීම
- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය (SOEs) ප්‍රතිව්‍යුහගත කිරීම
- ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් 50 සඳහා ආයතනික අභිප්‍රාය ප්‍රකාශ (SCI) ක්‍රියාවලිය නැවත සක්‍රිය කිරීම

**පුරවැසියන් මෙම ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටී**

# ආර්ථිකය ස්ථායීකරණය කිරීමට සහ වර්ධන ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමට අදාළ නීතිමය ප්‍රතිසංස්කරණ

## නව නීති

අ. නව ආයෝජන නීතිය
ආ. රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත
ඇ. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව නීතිය
ඈ. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණයට අදාළ නීතිය
ඉ. රාජ්‍ය සේවා රැකියා නියුක්ති පනත් කෙටුම්පත
ඊ. බදු දීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මත ලබා දී ඇති පරිශ්‍ර වල සන්තකය ආපසු ලබා ගැනීම
උ. වර්තමානයට ගැළපෙන, යාවත්කාලීන සහ ඒකාබද්ධ කම්කරු නීතියක් පැනවීම

## නීති ප්‍රතිසංස්කරණ

අ. සුරාබදු ආඥා පනත සංශෝධනය කිරීම
ආ. මුදල් පනත සංශෝධනය කිරීම
ඇ. විදේශ විනිමය පනත සංශෝධනය කිරීම
ඈ. බැංකුකරණ පනත සංශෝධනය කිරීම

** ඉහත පනත් සහ නීති සැකසීමේ සහ අනුමැතිය ලබාගැනීමේ විවිධ අදියරයන්හි පවතී*

# ගෝලීය වෙළෙඳපොළ වෙත ප්‍රවේශය ඉහළ නැංවීම

- ඉන්දියාව සහ චීනය වැනි ප්‍රධාන වෙළඳපොලවල් සමඟ ඒකාබද්ධ වීමේ උත්සාහයන් නැවත ආරම්භ කිරීම
- තායිලන්තය සමඟ වෙළඳ සාකච්ඡා නැවත ආරම්භ කිරීම
- සිංගප්පූරුව සමඟ පවතින නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම
- කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය වැනි ගතික කලාපීය වෙළඳ කටයුතු වල නිරත වීම
- සියලුම ජාත්‍යන්තර වෙළඳ සාකච්ඡා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳ කාර්යාලයක් පිහිටුවීම.
- කුරුඳු කර්මාන්ත සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම

# සංචාරක කර්මාන්තය

- සංචාරකයින්ට ක්‍රියාකාරකම්වල යෙදීමට අවශ්‍ය පහසුකම් හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම
- ත්‍රාසජනක ක්‍රීඩා/ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

# නව ආයතනික රාමුව

- දත්ත ආරක්ෂණ අධිකාරිය.
- සියලුම සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ගැටළු හඳුනාගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය.

# සමාජ ආරක්ෂණ ජාල

- 2002 සුබසාධන ප්‍රතිලාභ පනත නිසි ලෙස ක්‍රියාත්මක කිරීම
- සියලුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම ආවරණය වන පරිදි ලියාපදිංචි කිරීමේ ලේඛණය යාවත්කාලීන කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන අවිධිමත් ගෘහාශ්‍රිත ව්‍යාපාරවල නියැලී සිටින තරුණ කාන්තා ව්‍යවසායිකාවන් හට නව ණය යෝජනා ක්‍රමයක් මඟින් ප්‍රතිලාභ ලබා දීම
- කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන හරහා ගොවීන් කෘෂි ව්‍යවසායකයින් බවට පත් කර වැඩි රැකියා අවස්ථා ඇති කිරීම.
- ළමුන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා දැනට පවතින වැඩසටහන් ශක්තිමත් කිරීම
- සමාජ ආරක්ෂණ ආයතන, බෙදාහැරීමේ පද්ධති සහ ඉලක්ක කිරීම ශක්තිමත් කිරීම
- ගෘහාශ්‍රිත ව්‍යවසායකයින් ලෙස වැඩිහිටි, ආබාධිත සහ වැන්දඹු ප්‍රජාවගේ කුසලතා උපයෝජනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන වියදම් ප්‍රතිපාදන

## මූල්‍ය අංශය

1. බැංකු පද්ධතිය විනිශ්චය කිරීමේ ක්‍රියාවලිය තුළ වත්කම්වල ගුණාත්මකභාවය සමාලෝචනය කිරීමේ අංගය සම්පූර්ණ කිරීම
2. බැංකු පද්ධතියේ ප්‍රාග්ධනය සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලැස්මක් ගොඩනැංවීම සහ ශක්‍යතාවයක් නොමැති බව තක්සේරු කර ඇති බැංකු සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම
3. බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය
4. පුද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟයන් පියවා ගැනීමට නොහැකි ශක්‍යතා සහිත බැංකු සඳහා රජය විසින් ප්‍රාග්ධනය නැවත යෙදවීම වෙනුවෙන් ප්‍රමාණය, කාලය, උපකරණ සහ නියමයන් සහ කොන්දේසි මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කිරීම

*මූලාශ්‍රය: මහබැංකු වාර්ෂික වාර්තාව 2022*

## මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති

1. නව මහ බැංකු පනත

*මූලාශ්‍රය: මහබැංකු වාර්ෂික වාර්තාව 2022*

## රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවක් පිහිටුවීම (PERC)

2023.02.06 වැනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය ඇති කිරීම හා ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිණිස ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේදය යොදාගනිමින් ප්‍රධාන අමාත්‍යාංශ 10ක රාජ්‍ය වියදම් තාර්කිකකරණය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විශේෂඥයන්ගෙන් සමන්විත රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු 10ක් ස්ථාපිත කරන ලදී.

1. කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ආරක්ෂක අමාත්‍යාංශය
3. අධ්‍යාපන අමාත්‍යාංශය
4. සෞඛ්‍ය අමාත්‍යංශය
5. වාරිමාර්ග අමාත්‍යාංශය
6. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
7. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
8. මහජන ආරක්ෂක අමාත්‍යාංශය
9. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
10. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු මගින් එක් එක් රේඛීය අමාත්‍යාංශයේ සියළුම වැඩසටහන්/ ව්‍යාපෘති සමාලෝචනය කර, මූලික ක්‍රියාකාරකම් අදාළ අමාත්‍යාංශයේ කාර්යභාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව නිශ්චය කරගනු ලැබේ. තව ද, රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු විසින් ද්විකරණයන්, අපතේ යාම් හා අනවශ්‍ය වියදම් හඳුනාගනු ලබන අතර අමාත්‍යාංශයේ අරමුණු මෙන්ම ජාතික ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීම උදෙසා පවතින ශක්‍යතාවය අනුව සියළුම ක්‍රියාකාරකම් ප්‍රමුඛතාගත කරනු ලැබේ. මීට අමතරව, එක් එක් අමාත්‍යාංශය විසින් සිය සේවා සැපයීමේදී ඵලදායීතාවය හා පිරිවැය සඵලත්වය ප්‍රශස්ත කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ප්‍රතිසංස්කරණ ද මෙම කමිටු විසින් හඳුන්වාදෙනු ලැබේ.

කමිටු 7 ක වාර්තා දැනටමත් (2023/11/08 වන විට) අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර 2024 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වාර්තාවල නිර්දේශ දැනටමත් සලකා බලා ඇත.

# ප්‍රධාන අංශ මගින් රජය මුදල් වියදම් කරන ආකාරය

රු. බිලියන

| | අංශය | 2024 ආයෝජනය (ඇස්ත.) |
|---|---|---|
| 01 | **සෞඛ්‍ය** සම්පන්න සමාජයක් කරා | 529 |
| 02 | **දැනුම** පදනම් කරගත් ආර්ථිකයක් කරා | 532 |
| 03 | වේගවත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ සුවපහසු **ප්‍රවාහන** ජාලයක් | 430 |
| 04 | දැරිය හැකි සහ **සුවපහසු ජීවිතයක්** ගත කිරීමට පහසුකම් | 167 |
| 05 | නවීන සහ තිරසාර **කෘෂිකර්මාන්තයක්** - සෞඛ්‍යාරක්ෂිත, පෝෂ්‍යදායී ආහාරවේලක්, දැරිය හැකි මිලකට සහ තිරසාර ලෙස ජනතාවට ලබා දීම | 228 |
| 06 | **පරිසරය** තිරසාර ලෙස කළමනාකරණය | 36 |
| 07 | **සාමකාමී සාධාරණ** සමාජයක් සඳහා කැපවීම | 243 |
| 08 | **ජාතික ආරක්ෂාව** ශක්තිමත් කිරීම | 386 |
| 09 | **ආර්ථික සේවා** ශක්තිමත් කිරීම | 94 |
| 10 | වඩාත් පිරිසිදු, ආරක්ෂිත, පිරිමැසුම්දායී සහ විශ්වසනීය **බලශක්ති** සැපයුමක් | 62 |
| 11 | කාර්යක්ෂම සහ ඵලදායී ලෙස **මහජන සේවා** සැපයීම * | 469 |
| 12 | රාජ්‍ය සේවය **ඩිජිටල්කරණය** | 18 |
| 13 | **සමාජ ආරක්ෂණය** | 714 |
| | **සමස්ත එකතුව - අංශ** | 3,908 |
| | | |
| | **රාජ්‍ය ණය සේවාකරණය** | 3,919 |
| | පොළී ගෙවීම් | 2,651 |
| | ණය මුදලේ ආපසු ගෙවන කොටස | 1,268 |
| | **එකතුව (අංශ, හදිසි කළමනාකරණය සහ ණය සේවා)** | 7,827 |
| | අත්තිකාරම් ගිණුම | 6 |
| | **සමස්ත අයවැය** | 7,833 |

** හදිසි අවස්ථා කළමනාකරණය සඳහා වන විධිවිධාන ද මෙම කාණ්ඩය යටතේ ඇතුළත් වේ*

# 2024
# අයවැය
# සැකෙවින්

| | |
|---|---|
| සෞඛ්‍ය සම්පන්න සමාජයක් කරා | රු. බිලියන 529 |
| දැනුම පදනම් කරගත් ආර්ථිකයක් කරා | රු. බිලියන 532 |
| වේගවත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ සුවපහසු ප්‍රවාහන ජාලයක් | රු. බිලියන 430 |
| දැරිය හැකි සහ සුවපහසු ජීවිතයක් ගත කිරීමට පහසුකම් | රු. බිලියන 167 |
| නවීන සහ තිරසාර කෘෂිකර්මාන්තයක් - සෞඛ්‍යාරක්ෂිත, පෝෂ්‍යදායී ආහාරවේලක්, දැරිය හැකි මිලකට සහ තිරසාර ලෙස ජනතාවට ලබා දීම | රු. බිලියන 228 |
| පරිසරය තිරසාර ලෙස කළමනාකරණය | රු. බිලියන 36 |
| සාමකාමී සාධාරණ සමාජයක් සඳහා කැපවීම | රු. බිලියන 243 |
| ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම | රු. බිලියන 386 |
| ආර්ථික සේවා ශක්තිමත් කිරීම | රු. බිලියන 94 |
| වඩාත් පිරිසිදු, ආරක්ෂිත, පිරිමැසුම්දායී සහ විශ්වසනීය බලශක්ති සැපයුමක් | රු. බිලියන 62 |
| කාර්යක්ෂම සහ ඵලදායී ලෙස මහජන සේවා සැපයීම | රු. බිලියන 469 |
| රාජ්‍ය සේවය ඩිජිටල්කරණය | රු. බිලියන 18 |
| සමාජ ආරක්ෂණය | රු. බිලියන 714 |

# සෞඛ්‍ය
# සම්පන්න
# සමාජයක් කරා


# දිවයින පුරා රෝහල් ජාල

## තෘතියික සත්කාර රෝහල්

| | | |
|---|---|---|
| **ජාතික රෝහල්** | - | 02 |
| **ශික්ෂණ රෝහල්** | - | 11 |
| **විශේෂිත රෝහල්** | - | 18 |

- කාසල් වීදියේ කාන්තා රෝහල
- ද සොයිසා කාන්තා රෝහල
- රිජ්වේ ආර්යා ළමා රෝහල (LRH)
- ජාතික දන්ත වෛද්‍ය රෝහල
- මහමෝදර විශේෂඥ ශික්ෂණ රෝහල
- ජාතික බෝවන රෝග ආයතනය (අංගොඩ)
- මහරගම අපේක්ෂා රෝහල
- ජාතික මානසික සෞඛ්‍ය ආයතනය
- ජාතික අක්ෂි රෝහල
- ජාතික වෘක්කවේද කාන්දුපෙරීම් සහ බද්ධකිරීමේ ආයතනය
- ළය රෝහල, වැලිසර
- ලාදුරු රෝහල, හැඳල
- පුනරුත්ථාපන රෝහල, රාගම
- කේතුමතී කාන්තා රෝහල
- සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල

| | | |
|---|---|---|
| **දිස්ත්‍රික් මහ රෝහල්** | - | 19 |
| **පළාත් මහ රෝහල සෞඛ්‍ය** | - | 01 |



## නිදහස් සෞඛ්‍යය ශක්තිමත් කිරීම - 2024 වසරේදී ප්‍රමුඛතම ආයෝජන

- **සියලුම රජයේ රෝහල්වල නඩත්තු සහ වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 18.9**
- දිවයින පුරා සිටින සෞඛ්‍ය අංශයේ පුහුණුව සහ ධාරිතා සංවර්ධනය සඳහා **රු. බිලියන 16.9**
- පිළිකා රෝගීන් සඳහා උසස් තත්ත්වයේ රේඩියෝ චිකිත්සා පහසුකම් ස්ථාපිත කිරීම සඳහා **රු. බිලියන 2.2**
- ඌව, සබරගමුව, උතුරු මැද සහ මධ්‍යම පළාත්වල ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා **රු. බිලියන 8.5**
- රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා **රු. බිලියන 2.7**
- ජෛව වෛද්‍ය උපකරණ, රසායනාගාර උපකරණ රෝහල්වලට ලබාදීම සඳහා **රු. බිලියන 9.3**
- රෝගීන් සඳහා ආහාර සහ කාර්ය මණ්ඩල නිල ඇඳුම් සඳහා **රු. බිලියන 6.1**

## තෝරාගත් රෝහල් වල සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම

- තෝරාගත් රෝහල් 13 ක සෞඛ්‍ය පහසුකම් ශ්‍රේණිගත කිරීම (මෙම තෝරාගත් රෝහල්වලට X-ray යන්ත්‍ර, Multipara මොනිටර, MRI ස්කෑනර්, CT ස්කෑනර්, Cath Lab සහ අල්ට්‍රා සවුන්ඩ් ස්කෑනර් ආදියෙන් වෛද්‍ය උපකරණ ලබා දීම.) **රු. බිලියන 3.0**
- කරාපිටිය, අම්පාර සහ යාපනය රෝහල්වල විශේෂිත ළමා සත්කාර සංකීර්ණ - **රු. බිලියන 0.1**
- මහනුවර රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකය - **රු. බිලියන 0.25**
- මුල්ලේරියාව රෝහලේ ජාතික ආඝාත මධ්‍යස්ථානය - **රු. බිලියන 0.26**
- කරාපිටිය, මහනුවර සහ තෙලිප්පලෙයි පිළිකා රෝහල් - **රු. බිලියන 0.24**
- ළමුන් සඳහා හෘද මධ්‍යස්ථානය (රිජ්වේ ආර්යා ළමා රෝහල) - **රු. බිලියන 1.5**
- ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ බෝ නොවන රෝග ප්‍රතිකාර පහසුකම් - **රු. බිලියන 1.2**

## ප්‍රධාන සුබසාධන වැඩසටහන්

**රු. බිලියන 4.4**
"සුවසැරිය"
නොමිලේ ගිලන්රථ සේවාව

**රු. බිලියන 9.0**
මව්වරුන්ට සහ ළදරුවන්ට
අතිරේක පෝෂණ ආහාර සැපයීම
(ත්‍රිපෝෂ වැඩසටහන)

**රු. බිලියන 10.0**
ගැබිණි මව්වරුන්
265,000 කට පමණ
පෝෂ්‍යදායී ආහාර ඇසුරුම

**රු. බිලියන 2.1**
පෙර පාසල් ළමුන් 155,000 කට
පමණ උදෑසන ආහාරය

# දැනුම පදනම් කරගත් ආර්ථිකයක් කරා

# 2024 සඳහා රු. බිලියන 532

**රු. බිලියන 9.5**
යෞවන සහ ක්‍රීඩා

**රු. බිලියන 17.1**
වෘත්තීය පුහුණුව නවෝත්පාදන

**රු. බිලියන 402.2**
සාමාන්‍ය අධ්‍යාපනය

**රු. බිලියන 103.0**
විශ්ව විද්‍යාල අධ්‍යාපනය



විද්‍යා හා තාක්ෂණය සහ නවෝත්පාදන
**රු. බිලියන** 3.5

වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය
**රු. බිලියන** 12.9

නිපුණතා සිසු දිරිය
**රු. බිලියන** 0.7

## වෘත්තීය පුහුණුව නවෝත්පාදන සඳහා රු. බිලියන 17.1

පාසල් අධ්‍යාපනය සහ පිරිවෙන්
**රු. බිලියන** 358.5


පාසල් යටිතල පහසුකම් සංවර්ධනය
**රු. බිලියන** 25.2

විශේෂ අධ්‍යාපනය සහ උපකෘත පාසල්
**රු. බිලියන** 3.3

විභාග පැවැත්වීම සහ ඇගයීම් කටයුතු
**රු. බිලියන** 11.3

ගුරු සංවර්ධනය
**රු. බිලියන** 3.3

පෙර පාසල් අධ්‍යාපනය
**රු. බිලියන** 0.6



## සාමාන්‍ය අධ්‍යාපනය සඳහා රු. බිලියන 402.2



රාජ්‍ය විශ්ව විද්‍යාල කළමනාකරණය
**රු. බිලියන** 61.2

යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව
**රු. බිලියන** 32.0

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙ භික්ෂු විශ්ව විද්‍යාලය සහ SLIATE සඳහා ආධාර
**රු. බිලියන** 5.0

මහපොළ, ශිෂ්‍යාධාර සහ අනෙකුත් සුබසාධන වැඩසටහන්
**රු. බිලියන** 2.5

රාජ්‍ය විශ්ව විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීමට නොහැකි වූ සිසුන් සඳහා පොළී රහිත ණය යෝජනා ක්‍රමය
**රු. බිලියන** 2.0

**විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා රු. බිලියන** 103.0


# 2024 වසරේදී ප්‍රමුඛතම ආයෝජන

## දරුවන් සඳහා ආයෝජනය

- දිවයින පුරා පාසල් 10,155 ක පමණ අඛණ්ඩ හා වැඩිදියුණු කළ අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් **රු. බිලියන 357.0**
- පාසල් පහසුකම් පුනරුත්ථාපනය හා නඩත්තුව සඳහා **රු. බිලියන 4.6**
- ගුණාත්මක වැඩිදියුණු කිරීම, පාසල්වල ප්‍රමිතීන් නඩත්තු කිරීම, පාසල් මූලික කළමනාකරණය සවිබල ගැන්වීම සහ දිවයින පුරා පාසල්වල සමාජ ආරක්ෂණය සඳහා **රු. බිලියන 8.0**
- ICT මධ්‍යස්ථාන/ සුහුරු පන්ති කාමර සඳහා **රු. බිලියන 1.1**

## නිපුණතා සංවර්ධනය සඳහා ආයෝජනය

- තාක්ෂණික විද්‍යාල සහ තාක්ෂණික පුහුණු සංවර්ධනය සඳහා **රු. බිලියන 0.45**
- නියාගම සහ ගම්පහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා **රු. බිලියන 1.0**
- TVET අභ්‍යාසලාභීන්ගේ රැකියා තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා **රු. බිලියන 0.66**



පාසල්වල තාක්ෂණික විද්‍යාගාර සංවර්ධනය සඳහා

**රු. බිලියන 4.2**

## යෞවනයන් සඳහා ආයෝජනය

- රාජ්‍ය විශ්වවිද්‍යාලවල මානව සම්පත් කළමනාකරණය සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා **රු. බිලියන 61.2**
- වයඹ, කැලණිය, රජරට, සබරගමුව සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලවල තාක්ෂණවේදීන් බිහිකිරීම සඳහා තාක්ෂණ පීඨ ඉදිකිරීමට **රු. බිලියන 5.6**
- පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය සඳහා **රු. බිලියන 0.83**
- තරුණ සවිබල ගැන්වීම සඳහා (ජාතික යොවුන් සේනාංකය, ජාතික තරුණ සේවා සභාව) **රු. බිලියන 4.6**

**රු. බිලියන 10.3**

විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ සහ මහාචාර්ය ඒකකය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා

# අධ්‍යාපනය සම්බන්ධ ප්‍රමුඛ සහනාධාර / සුබසාධන වැඩසටහන්

### පෙර පාසල් අධ්‍යාපනය


- ගුරු අභිමානී (පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනාව) - **රු. බිලියන 0.55**

### පාසල් අධ්‍යාපනය


- නොමිලේ පෙළ පොත් ලබා දීම - **රු. බිලියන 20.0**
- සිසුන් මිලියන 4.5 කට පමණ පාසල් නිල ඇඳුම් ලබාදීම - **රු. බිලියන 6.0**
- සිසුන් මිලියනයක් පමණ ඉලක්ක කරගත් පාසල් පෝෂණ ආහාර වැඩසටහන - **රු. බිලියන 16.7**
- දුෂ්කර හා අති දුෂ්කර පාසල්වල සිසුන් 728,000 කට පමණ සපත්තු - **රු. බිලියන 2.5**
- සියලුම සිසුන් සඳහා "සුරක්ෂා" සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම - **රු. බිලියන 2.0**
- 5 ශ්‍රේණියේ සිසුන් සඳහා ශිෂ්‍යත්ව - **රු. බිලියන 0.94**

### උසස් සහ තාක්ෂණික අධ්‍යාපනය

- විශ්වවිද්‍යාල සිසුන් 100,000කට පමණ මහපොළ සහ ශිෂ්‍යාධාර - **රු.බිලියන 2.5**
- රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි සිසුන් සඳහා පොළී රහිත ණය යෝජනා ක්‍රමය - **රු. බිලියන 2.0**
- වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබන සිසුන් සඳහා "නිපුණතා සිසු දිරිය" ශිෂ්‍යත්ව වැඩසටහන - **රු. බිලියන 0.7**
- තාක්ෂණික අධ්‍යාපනයේ සිසුන් සඳහා වාර ප්‍රවේශ පත්‍රය - **රු. බිලියන 0.18**
- ජාතික ක්‍රීඩා සංචිත සඳහා පෝෂණය - **රු. බිලියන 0.28**




# වේගවත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ සුවපහසු ප්‍රවාහන ජාලයක්



# 2024 වසර සඳහා රු. බිලියන 430 ක්



| රු. බිලියන 7.0 | රු. බිලියන 98 | රු. බිලියන 325 |
|---|---|---|
| වරාය සහ ගුවන් සේවා | ප්‍රවාහනය | මාර්ග සංවර්ධනය |




**වරාය සහ ගුවන් සේවා**
**රු. බිලියන** 7.0

| | |
|---|---|
| වරාය සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | **රු. බිලියන** 6.4 |
| ආයතනික සහාය | **රු. බිලියන** 0.6 |

| | |
|---|---|
| දුම්රිය ඇණිය සහ අනෙකුත් යටිතල පහසුකම් නඩත්තුව | **රු. බිලියන 12.5** |
| රේල් පාර සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | **රු. බිලියන 29.2** |
| නව දුම්රිය මැදිරි ලබාදීම | **රු. බිලියන** 1.4 |
| අදාළ ආයතන සඳහා ආයතනික සහාය | **රු. බිලියන** 38.8 |
| ශ්‍රීලංගම බස් රථ ඇණිය ශක්තිමත් කිරීම | **රු. බිලියන** 3.2 |
| වාර ප්‍රවේශපත්‍ර, බස් ප්‍රවේශ පත්‍ර සහ අනෙකුත් සුබසාධන කටයුතු | **රු. බිලියන** 12.9 |



**ප්‍රවාහනය**
**රු. බිලියන** 98



**මාර්ග සංවර්ධනය**
**රු. බිලියන** 325

| | |
|---|---|
| පාලම් සහ ගුවන් පාලම් සංවර්ධනය | **රු. බිලියන . 19.7** |
| මාර්ග නඩත්තුව සහ වැඩිදියුණු කිරීම | **රු. බිලියන 28** |
| අධිවේගී මාර්ග සංවර්ධනය | **රු. බිලියන 99.4** |
| මාර්ග සංවර්ධනය | **රු. බිලියන 177.6** |

# 2024 වසරේ ප්‍රමුඛතම ආයෝජන

## මාර්ග

- කි.මී.12,000 ක පමණ දිගින් යුතු ජාතික මාර්ග ජාලය සහ ඒ ආශ්‍රිත පාලම් 4,500 ක පමණ සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා **රු. බිලියන 21**
- බාලදක්ෂ මාවත සහ චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, උත්තරානන්ද මාවත සහ විනිසුරු අක්බාර් මාවත සම්බන්ධ කරමින් දුම්රිය මාර්ගයට ඉහලින් සහ කොහුවල යන ස්ථානවල ආරම්භ කර ඇති ගුවන් පාලම් නිම කිරීම - **රු. බිලියන 4**
- කිලෝමීටර් 140 ක් දිග බදුල්ල - චෙන්කලඩි මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම - **රු. බිලියන 6**
- මහනුවර නගරයේ නවීන බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදිකිරීම - **රු. බිලියන 11**
- මාර්ග ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අත්කරගත් ඉඩම්වලට වන්දි ගෙවීම **රු. බිලියන 14.5**
- විවිධ ව්‍යාපෘති යටතේ ආරම්භ කර ඇති ග්‍රාමීය පළාත් සහ ජාතික මාර්ගවල තීරණාත්මක කටයුතු නිම කරමින් ඒවායේ වාහන ගමන් කල හැකි තත්ත්වයට පත් කිරීම **රු. බිලියන 43**
- ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය කි.මී. 7.4 , මහරගම පිලියන්දල මාර්ගයේ කි.මී. 5.4 , කොට්ටාව තලගල මාර්ගයේ කි.මී. 14.5 ක් සහ කුරිච්චිවන්කර්නි පාලම අළුත්වැඩියාව - **රු. බිලියන 3**
- දැනට සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති ග්‍රාමීය මාර්ග සහ ග්‍රාමීය පාලම්වල අත්‍යාවශ්‍ය කටයුතු නිම කිරීම **රු. බිලියන 1.3**
- දිවයින පුරා ග්‍රාමීය පාලම් ඉදිකිරීම **රු. බිලියන 7.1**

**කඩවත සිට මීරිගම දක්වා සහ පොතුහැර සිට රඹුක්කන දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයේ** ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා **රු. බිලියන 73.0 කි.**

ඉඟුරුකඩේ හන්දියේ සිට වරාය නගරය දක්වා කිලෝමීටර් 5.3ක් දිග **වරාය ප්‍රවේශ කුළුණු මතින් ඉදිවන අධිවේගී මාර්ගය සඳහා රු. බිලියන 20.0ක්**

ග්‍රාමීය ප්‍රදේශවල ධාවනය කිරීමට **ලංගමයට බස්රථ 600 ක්** මිලදී ගැනීම **සඳහා රු බිලියන 3.2ක්.**

## පොදු ප්‍රවාහනය

- දුම්රිය ස්ථාන 340 ක් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සහ දුම්රිය ආසන වෙන් කිරීම සඳහා විද්‍යුත් ප්‍රවේශපත්‍ර ලබා දීමේ පද්ධතියක් හඳුන්වා දීම - **රු. බිලියන 14**
- දුම්රිය මාර්ග, දුම්රිය ඇණිය (දුම්රිය එන්ජින්, දුම්රිය මැදිරි සහ ඩීසල් දුම්රිය බලවේග කට්ටල) සහ දුම්රිය සංඥා පද්ධතිය නඩත්තු කිරීම - **රු. බිලියන 10.5**
- කි.මී 130 ක දිගින් යුත් මහව - ඕමන්ත දුම්රිය මාර්ගය, කි.මී 10 දිගින් යුතු මහනුවර - පේරාදෙණිය - කඩුගන්නාව දුම්රිය මාර්ගය නඩත්තු කිරීම - **රු. බිලියන 13.3**
- දුම්රිය ධාවනය සඳහා ඉන්ධන ලබාදීම - **රු. බිලියන 15.3**
- බස්රථ එංජින්, ගියර් පෙට්ටි සහ බස් රථ වල කොටස් නඩත්තු කිරීම මගින් බස් රථ ඇණිය ශක්තිමත් කිරීම - **රු. බිලියන 1.5**

## වරාය

- කොළඹ වරාය පුළුල් කිරීම සහ කන්කසන්තුර වරාය පුනරුත්ථාපනය - **රු බිලියන 5.3**

### ප්‍රධාන සහනාධාර වැඩසටහන්

- පාසැල් ගමන් ප්‍රවේශ පත්‍ර (මසකට ප්‍රවේශ පත්‍ර 536000) - **රු. බිලියන 10.5**
- ත්‍රිවිධ හමුදා නිදහස් ගමන් ප්‍රවේශ පත්‍ර ( වාර්ෂිකව 29000) - **රු. බිලියන 0.4**
- ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන මාර්ගවල බස්රථ ධාවනට (දිනකට මාර්ග 1500 ක පමණ කි.මී 271000) - **රු බිලියන 2**
- සාමාජීය වශයෙන් අත්‍යාවශ්‍ය බස් සේවා (සිසු සැරිය, නිසි සැරිය, ගැමි සැරිය, රාත්‍රී බස් රථ සේවා) පවත්වාගෙන යාම - **රු. බිලියන 2**
- ශ්‍රී ලංගම සඳහා මූල්‍ය අනුග්‍රහය - **රු. බිලියන 0.1**



# දැරිය හැකි සහ සුවපහසු ජීවිතයක් ගත කිරීමට පහසුකම්

## 2024 වසර සඳහා රු. බිලියන 167



නාගරික සංවර්ධන හා නිවාස

**රු. බිලියන 47**



ජල සැපයුම

**රු. බිලියන 120.0**

## නාගරික සංවර්ධන හා නිවාස - රු බිලියන 47

| | රු. බිලියන |
|---|---|
| නාගරික සංවර්ධනය | 8.0 |
| ග්‍රාමීය හා අර්ධ නාගරික යටිතල පහසුකම් | 10.6 |
| නිවාස සංවර්ධනය | 28.0 |

## ජල සැපයුම - රු. බිලියන 120.0

| | රු. බිලියන |
|---|---|
| ජලසම්පාදන යෝජනා ක්‍රම සංවර්ධනය | 75.0 |
| ජලසම්පාදන යෝජනා ක්‍රමවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | 13.8 |
| ජලසම්පාදන ක්‍රමවල ධාරිතාව ඉහළනැංවීම | 10.0 |
| සනීපාරක්ෂාව / අපජල බැහැර කිරීම සංවර්ධනය | 11.6 |
| ග්‍රාමීය හා ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම සංවර්ධනය | 9.6 |

## 2024 වසරේ ප්‍රමුඛතම ආයෝජන

- නිවාස මිලියනයකට පමණ නලජල පහසුකම් සැපයීමට හැකිවන පරිදි කුණ්ඩසාලේ, හාරිස්පත්තුව, පාතදුම්බර, පූජාපිටිය, අකුරණ, යටිනුවර, යාපනය, නල්ලූර්, වේලාහි, කයිට්ස්, වෙන්කායි, පලෙයි, මහව, පොල්පිතිගම, මාතලේ, උකුවෙල, රත්තොට, නාවුල, යටවත්ත, පල්ලෙපොල, අඹන්ගඟ, රුවන්වැල්ල, බුලත්කොහුපිටිය, යටියන්තොට, පදවිය, හොරොවුපතාන, කහටගස්දිගිලිය, කැබැතිගොල්ලෑව සහ රඹෑව ප්‍රදේශවල ඇති නල ජල යෝජනාක්‍රමවල ධාරිතාව ඉහල නැංවීම. - **රු. බිලියන 29.7**

- කඩුවෙල, කෝට්ටේ, කොලොන්නාව සහ ශ්‍රී ජයවර්ධනපුර යන ප්‍රදේශවලට නල ජලය සපයන පද්ධතියේ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහල නැංවීම - **රු බිලියන 5.0**

- නව නල ජල සම්බන්ධතා 475, 000 ක් පමණ සහ අපජල බැහැර කිරීමේ සම්බන්ධතා 8,000 ක් පමණ ලබා දීම සඳහා දැනට පවතින නලජල යෝජනා ක්‍රම සහ අපජල බැහැර කිරීමේ යෝජනා ක්‍රම වල ධාරිතාවය ඉහල නැංවීම - **රු. බිලියන 10.0**

- නුවරඑළිය, මොණරාගල, කිලිනොච්චි, මුලතිව්, බදුල්ල, කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික් වල ප්‍රජා ජල සම්පාදන ක්‍රම මඟින් පිරිසිදු ජලය ලබාදීම - **රු. බිලියන 6.2**

- මහනුවර නාගරික ප්‍රදේශය, යටිනුවර, රත්මලාන, මොරටුව, කැලණිය, මීගමුව, ගාල්ල නගර සභා ප්‍රදේශය, කොළඹ මහනගර සභා ප්‍රදේශය, උණවටුන හා පෑලියගොඩ ප්‍රදේශය සඳහා නල අපජල බැහැර කිරීමේ පහසුකම් ලබා දීම - **රු. බිලියන 11**

ඇපල්වත්ත, මාදම්පිටිය, රජවත්ත, සිරිල් පෙරේරා මාවත, බ්ලූමැන්ඩල් මහල් නිවාස, දෙමටගොඩ, කාලිංග මාවත - කොළඹ 05 සහ ටොරින්ටන් මාවත - කොළඹ 07 යන ප්‍රදේශවල ජීවත්වන **නාගරික වතුවාසීන්ට සුවපහසු නිවාස 50,000 ක් ලබාදීම සඳහා රු. බිලියන 15.4ක්**

පෑලියගොඩ, දෙමටගොඩ, මහරගම, මොරටුව සහ කොට්ටාව ප්‍රදේශවල **අඩු ආදායම්ලාභී නිවාස 2,000 ක් සඳහා රු. බිලියන 3.2ක්**

උතුරු කොළඹ, නැගෙනහිර කොළඹ, කොළඹ දකුණ සහ බටහිර කොළඹ යන ප්‍රදේශවල **ආදායම් නොලබන ජලය 49% සිට 18% දක්වා අඩු කිරීම සඳහා රු. බිලියන 8.7ක්**

## නිවාස

- නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම් ලාභීන් , විරු සුමිතුරු සහ වකුගඩු රෝගාබාධ වලින් පෙළෙන ජනතාව සඳහා නිවාස ඒකක 18500 කට වැඩි ප්‍රමාණයක් ලබා දීම - **රු. බිලියන 2**

- උතුරු නැගෙනහිර අවතැන් ජනතාව සඳහා නිවාස ඒකක 6759 ක් පමණ ලබා දීම - **රු. බිලියන 2**

- වතු ආශ්‍රිත ප්‍රදේශවල වෙසෙන ජනතාව වෙනුවෙන් නිවාස ඒකක 10000 ක් පමණ ලබා දීම - **රු. බිලියන 4.6**

## නාගරික සංවර්ධන

- බස් නැවතුම, නාගරික උයන්, රථගාල්, වාණිජ සහ පොදු පහසුකම් ලබා දෙමින් නගර 100ක් සංවර්ධනය කිරීම - **රු. බිලියන 0.6**

- අනුරාධපුර නගරය සංවර්ධනය කිරීම - **රු. බිලියන 2**

- යාපනය නගරශාලාව පුනරුත්ථාපනය කිරීම - **රු. බිලියන 0.4**

## ප්‍රධාන සහනාධාර වැඩසටහන්

- "සොදුරු පියස", "සිහින මාළිගාව" සහ මධ්‍ය ආදායම්ලාභී පවුල් වෙත නිවාස මිලදී ගැනීමට ලබාදුන් ණය පහසුකම් සඳහා පොළී ගෙවීම - **රු. බිලියන 0.4**

# නවීන සහ තිරසාර කෘෂිකර්මාන්තයක් -

## සෞඛ්‍යාරක්ෂිත, පෝෂ්‍යදායී ආහාරවේලක්, දැරිය හැකි මිලකට සහ තිරසාර ලෙස ජනතාවට ලබාදීම

# 2024 සඳහා රු. බිලියන 228




- වැව්, ජලාශ, අමුණු, ඇළ මාර්ග සහ අනෙකුත් වාරිමාර්ග ආශ්‍රිත යටිතල පහසුකම් නඩත්තුව සහ වැඩිදියුණු කිරීම **රු. බිලියන 13.8**
- අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කෘෂි නිෂ්පාදනවල අගය එකතු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ නව තාක්ෂණය ව්‍යාප්ත කිරීම **රු. බිලියන 14.3**
- කෘෂි කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් වල සහ කෘෂි කාර්මික නිෂ්පාදනයන්ගේ දේශගුණික විපර්යාස සඳහා දක්වන ප්‍රතිරෝධීතාවය ඉහළ නැංවීම **රු. බිලියන 25.6**
- ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා දීම **රු. බිලියන 1.3**
- මහවැලිය ආශ්‍රිත ජලාශ වල තිරසාර බව සහතික කිරීම **රු. බිලියන 5.3**
- ගන්දර ධීවර වරාය ඉදිකිරීම **රු. බිලියන 3.5**
- මයිලඩි,මාවැල්ල සහ රැකව ධීවර වරාය ආශ්‍රිත නැංගුරම් සංවර්ධනය **රු. බිලියන 0.4**
- රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම **රු. බිලියන 9.0**
- ඉඩම් කට්ටි මිලියන 16 ක මැනුම් කටයුතු සිදුකිරීම සහ ඔප්පු නිකුත් කිරීම -,බිම් සවිය, **රු. බිලියන 0.4**

යාන්ඔය, උමාඔය, තල්පිටිගල ජලාශය, මොරගහකන්ද සහ කළුගඟ ඇතුළු නව ජලාශ සහ දැනට පවතින **ජලාශවල ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා රු. බිලියන 50.0**

## කෘෂිකර්ම අංශයේ සුබසාධන / සහනාධාර

- දිවයින පුරා ක්‍රියාත්මක පොහොර සහනාධාර ලබා දීම - **රු. බිලියන 19.5**
- ගොවීන් 175,000 ක් සඳහා ගොවි විශ්‍රාම වැටුප - **රු. බිලියන 5.3**
- වගා හානි සඳහා රක්ෂණය - **රු. බිලියන 1.0**
- රබර් නැවත වගා කිරීම, අළුත් වගාකිරීම සඳහා සහනාධාරය - **රු. බිලියන 0.5**
- කුඩා හා මධ්‍ය පරිමාණ පොල් වගාකරුවන් දිරිමත් කිරීම - **රු. බිලියන 0.5**
- කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම හා අපනයන දිරිමත් කිරීම සඳහා ලබා දෙන ආධාර - **රු. බිලියන 1.6**
- තේ සහ රබර් වගාකරුවන්ට වගාව වැඩි දියුණු කිරීමට ලබා දෙන සහනාධාර - **රු. බිලියන 0.27**
- තේ සඳහා සහනාධාර නව වගා කිරීම, නැවත වගා කිරීම සහ අඩු පිරවීම - **රු. බිලියන 0.5**
- අපනයනය ඉලක්ක කරගත් සුළු භෝග සහ ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් සඳහා සහනාධාර - **රු. බිලියන 0.4**
- 'දියවර දිරිය' ණය යෝජනා ක්‍රමය - **රු. බිලියන 0.013**



# පරිසරය

# තිරසාර ලෙස කළමනාකරණය

## 2024 සඳහා රු. බිලියන 36

**රු. බිලියන 16.3**
ආපදා හා
වැසි ජල කළමනාකරණය

**රු. බිලියන 5.6**
පරිසරය



**රු. බිලියන 6.3**
අපද්‍රව්‍ය
කළමනාකරණය


**රු. බිලියන 7.9**
වනජීවී සංරක්ෂණය

## 2024 දී ප්‍රමුඛ ආයෝජන

- ආපදා බලපෑම් අවම කිරීම, නායයෑම් අවදානම් ප්‍රදේශවලින් වෙනත් ස්ථානවල නැවත පදිංචි කිරීම, නායයෑම් අවදානම අවම කිරීම ඇතුළු ආපදාවලින් ජනතාව ආරක්ෂාව සහතික කිරීම සඳහා **රු. බිලියන** 13.0
- කාලගුණ විද්‍යා කටයුතු සඳහා **රු. බිලියන** 1.8
- වන සංරක්ෂණය සහ ආවරණය පුළුල් කිරීම සඳහා **රු. බිලියන** 1.1
- කර්මාන්ත සඳහා පරිසර හිතකාමී තාක්ෂණයන් සැපයීම සඳහා **රු. බිලියන** 1.0
- කොලොන්නාව, කැලණිය, ඔලියමුල්ල, දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, මහරගම ප්‍රදේශවල වැසි ජල කළමනාකරණය සඳහා **රු. බිලියන** 1.55
- දැනට පවතින විදුලි වැටවල් කිලෝමීටර 500ක් පමණ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා **රු. බිලියන** 0.15

කොළඹ මහනගර කලාපයේ පළාත් පාලන ආයතනවලින් **දිනක එක්රැස් කරන ටොන් 1200 ක නාගරික ඝන අපද්‍රව්‍ය** වෙනුවෙන් අවසාන බැහැර කිරීමේ පහසුකම සැපයීම සඳහා **රු. බිලියන 5.5**

# සාමකාමී සහ
# සාධාරණ
# සමාජයක් සඳහා
# කැපවීම




## 2024 දී ප්‍රමුඛ ආයෝජන



**අධිකරණ සහ බන්ධනාගාර**

### අධිකරණ

- ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය නවීකරණය සහ ප්‍රතිසංස්කරණය සඳහා **රු. බිලියන 2.6**
- අනුරාධපුර, මාතලේ, යාපනය, පොළොන්නරුව, ගාල්ල, මාතර, ගම්පොළ, වලපනේ, වත්තල, රුවන්වැල්ල, මුලතිව්, මාන්කුලම්, රත්නපුර, වැලිමඩ, කිලිනොච්චි, තෙල්දෙණිය, කන්තලේ සහ පූගොඩ යන ප්‍රදේශවල අධිකරණ ඉදිකිරීම සඳහා **රු. බිලියන 1.2**
- මහේස්ත්‍රාත් අධිකරණ ඉදිකිරීම සඳහා **රු. බිලියන 1.0**
- දිවයින පුරා අධිකරණ 223 ක් සහ කම්කරු විනිශ්චය සභා 39 ක් පරිපාලනය සඳහා **රු. බිලියන 9.3**

### බන්ධනාගාර

- සිරකරුවන් සඳහා ආහාර සැපයීම සඳහා **රු. බිලියන 6.0**
- බන්ධනාගාරවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා **රු. බිලියන 0.4**

## ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

- සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා **රු. බිලියන 10.0**
- ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ශක්තිමත් කිරීම සඳහා **රු. බිලියන 4.3**
- මානව හිමිකම් ශක්තිමත් කිරීම සඳහා **රු. බිලියන 0.38**

## සිවිල් ආරක්ෂාව

- සිවිල් ආරක්ෂක නිලධාරීන් 33,800කට පමණ වැටුප් සහ දීමනා ගෙවීම සඳහා **රු. බිලියන 17.9**

## මහජන ආරක්ෂාව

- 82,000 කට වැඩි පොලිස් නිලධාරීන්ගේ වැටුප් සහ දීමනා ගෙවීම සඳහා **රු. බිලියන 80.2**
- පොලිස් නිලධාරීන්හට ආහාර හා නිල ඇඳුම් ලබාදීම සඳහා **රු. බිලියන 5.4**

### දේශසීමා පාලන පියවර

- නව ගමන් බලපත්‍ර මිලදී ගැනීම සහ බෙදා හැරීම් සඳහා රු. බිලියන 1.7

### පුද්ගලයන් ලියාපදිංචි කිරීම

- හැඳුනුම්පත් සඳහා පෙර මුද්‍රිත කාඩ්පත් මිලදී ගැනීම සඳහා **රු. බිලියන 1.0**

අල්ලස හා දූෂණයෙන් තොර සමාජයක් බවට පත් කිරීම වෙනුවෙන් 2023 අංක 9 දරන **දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීම සඳහා රු. බිලියන 4.2**

## ආගමික සහ සංස්කෘතික කටයුතු

- ලේඛනාරක්ෂක කළමනාකරණය සහ සංරක්ෂණ ව්‍යාපෘති සඳහා **රු. බිලියන 1.2**
- පුරාවිද්‍යා සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘති සඳහා **රු. බිලියන 0.23**
- ජෝන් ද සිල්වා රඟහල, ජාතික කලාභවන, ටවර් හෝල් රඟහල, ගාලු උරුමය, කන්ද උඩරට උරුමය, ජනකලා කේන්ද්‍රය, ශ්‍රී ලංකා කලා මණ්ඩලය සහ අමරදේව අසපුව මෙන්ම නාට්‍ය, සංගීතය, නැටුම් ඇතුළු රංග කලා කටයුතු ප්‍රවර්ධනය සහ නඩත්තු කටයුතු සඳහා **රු. බිලියන 0.34**
- ආගමික හා සංස්කෘතික උත්සව සඳහා **රු. බිලියන 0.1**

**දහම් පාසල් සම්බන්ධ ප්‍රමුඛ සුබසාධන වැඩසටහන්**

- සිසුන් සඳහා දහම් පාසල් පෙළ පොත් - **රු. බිලියන 0.25**
- දහම් පාසල් ගුරුවරුන්ට පහසුකම් සැලසීම - **රු. බිලියන 0.63**

# ජාතික ආරක්ෂාව

# ශක්තිමත් කිරීම

## 2024 සඳහා රු. බිලියන 386

**රු. බිලියන**
**357.3**
ජාතික ආරක්ෂාව

**රු. බිලියන**
**28.6**
වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම

## 2024 දී ප්‍රමුඛ ආයෝජන


- අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ල අංක 1,2,3, සහ 4 නිම කිරීම සඳහා **රු. බිලියන 9.0**
- ත්‍රිකුණාමලය තටාකාංගනයේ වරාය ඉදිකිරීම සඳහා **රු. බිලියන 1.6**
- ත්‍රිවිධ හමුදාවේ වැටුප්, සහ අනෙකුත් දීමනා සඳහා **රු. බිලියන 187.4**
- ත්‍රිවිධ හමුදාවේ ආහාර සහ නිල ඇඳුම් සඳහා **රු. බිලියන 98.7**
- ත්‍රිවිධ හමුදාවේ වත්කම් නඩත්තුව, පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම සඳහා **රු. බිලියන 28.6**

### අංශයේ සුබසාධන / සහනාධාර

- 253,110 ක් පමණ වන ප්‍රතිලාභීන් සඳහා “රණවිරු මාපිය” දීමනා - **රු. බිලියන 2.3**



# ආර්ථික සේවා
# ශක්තිමත් කිරීම




## තැපැල් සඳහා රු. බිලියන 20.0

| | රු. බිලියන |
|---|---|
| දිවයින පුරා තැපැල් සේවය පවත්වාගෙන යාම සඳහා වැටුප් සහ අනෙකුත් දීමනා | 15.0 |

## වෙළෙඳ සහ වාණිජ සඳහා රු. බිලියන 2.2

| | රු. බිලියන |
|---|---|
| පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම | 0.5 |
| ගබඩා ඉදිකිරීම | 0.3 |

## සංචාරක ව්‍යාපාරය සඳහා රු.බිලියන 2.3

| | රු. බිලියන |
|---|---|
| උද්භිද උද්‍යාන සංවර්ධනය | 0.83 |
| සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම | 1.5 |

## කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය සම්පත් සහතික කිරීම රු. බිලියන 52.2

| | රු. බිලියන |
|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමට සහාය වීම | 26.6 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය සහතිකය | 17.5 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය | 1.9 |

## ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රුපියල් බිලියන 10.2

| | රු. බිලියන |
|---|---|
| කොළඹ මූල්‍ය නගරයට පහසුකම් සැපයීම | 1.5 |
| කර්මාන්ත ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | 1.8 |
| ආයතන හරහා කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම | 6.1 |
| කර්මාන්ත සඳහා තාක්ෂණ හුවමාරුව | 0.8 |

## ඵලදායි ශ්‍රම බලකාය සඳහා රුපියල් බිලියන 6.8

| | Rs Bn |
|---|---|
| ආරක්ෂිත නිත්‍ය ශ්‍රම සංක්‍රමණයට සහාය වීම | 0.2 |

## 2024 දී ප්‍රමුඛ ආයෝජන

- කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා **රු. බිලියන 1.0**
- වගවත්ත සහ බිංගිරිය කර්මාන්ත කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා **රු. බිලියන 0.5**
- නිෂ්පාදන ව්‍යාප්ත කිරීම සඳහා ආර්ථික හෝ මූල්‍යමය වශයෙන්ශක්‍ය ව්‍යාපෘති ආරම්භ කිරීමට හෝ පුළුල් කිරීමට සමාගම්වලට මූල්‍ය ආධාර සැපයීම සඳහා **රු. බිලියන 2.5**
- ඵලදායි ශ්‍රම බලකායක් ඇති කර ගැනීමට පහසුකම් සැලසීම සහ මග පෙන්වීම සඳහා **රු. බිලියන 6.8**
- කොළඹ මූල්‍ය නගරයේ සීමාව දක්වා උපයෝගිතා සේවා සැපයීම සඳහා **රු .බිලියන 1.5**
- නුවරඑළිය, කල්පිටිය, ඇල්ල, අරුගම්බොක්ක වැනි සංචාරක ගමනාන්ත සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට **රු. බිලියන 0.6**
- ගම්පහ, හම්බන්තොට, අවිස්සාවේල්ල සහ හග්ගල පිහිටි උද්භිද උද්‍යාන කළමනාකරණය සඳහා **රු. බිලියන 0.81**

ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් මධ්‍යම හා කුඩා ව්‍යවසායකයින් සඳහා ස්ථිර කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා වන හදිසි ප්‍රතිචාර සංරචකය ව්‍යවසායක මූලාරම්භයන් ඉලක්ක කර ගනිමින් **කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය ණය ලබා දීම සඳහා රුපියල් බිලියන 26.6 කි.**

ඇපකර අවශ්‍යතා සොයා ගැනීමේදී දුෂ්කරතා ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන මූල්‍ය බාධක සඳහා ප්‍රවේශය සහතික කිරීම සඳහා **ජාතික ණය සහතික කිරීමේ ආයතනයක් පිහිටුවීම රුපියල් බිලියන 17.5**

# වඩාත් පිරිසිදු,
# ආරක්ෂිත,
# පිරිමැසුම්දායී සහ
# විශ්වසනීය බලශක්ති
# සැපයුමක්

# 2024 වසර සඳහා රු. බිලියන 62

**රු. බිලියන 27.0**
සූර්ය පුනර්ජනනීය බලශක්තිය

**රු. බිලියන 35.0**
පද්ධති වැඩිදියුණු කිරීම



- පරිසර හිතකාමී හා අඩු පිරිවැයකින් යුතු බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත මාරුවීම සඳහා **වහල මත සවි කරන සූර්ය බලශක්ති උත්පාදන පද්ධතිවලට අදාළ ණය සඳහා රු. බිලියන 18.0**

- කොළඹ අපද්‍රව්‍ය බලශක්ති බලාගාරය - අපද්‍රව්‍ය ශක්තිය බවට පරිවර්තනය කිරීම සඳහා **රු. බිලියන 1.7**

- හම්බන්තොට **බැටරි බලශක්ති ගබඩාව සඳහා රු. බිලියන 3.2**


- **ආගමික ස්ථානවලට සූර්යබල පහසුකම්** සැපයීම සඳහා **රු. බිලියන 1.1**

- කුඩා දූපත් වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම සඳහා - ඩෙල්ෆ්ට්, අනලතිව්, නයිනතිව් **රු. බිලියන 3.6**



- **හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ** මාර්ග සංවර්ධනය සහ සම්ප්‍රේෂණ ධාරිතාව ඉහළ නැංවීම සහ ජාතික විදුලිබල පද්ධතියේ සම්ප්‍රේෂණ හානි අවම කිරීම සහ මොරගොල්ල විදුලි බලාගාරය සඳහා **රු. බිලියන 30.0**


# කාර්යක්ෂම සහ ඵලදායී ලෙස මහජන සේවා සැපයීම




## 2024 දී ප්‍රමුඛ ආයෝජන


- විදේශ රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීම සහ සහයෝගීතාව පුළුල් කිරීම සඳහා **රු. බිලියන** 19.6
- ධාරිතා සංවර්ධනය සඳහා **රු. බිලියන** 0.98
- ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සපයනු ලබන සේවාවන් අඛණ්ඩව සැපයීම සඳහා **රු. බිලියන** 46.5
- පළාත් සභා සහ පළාත් පාලන සේවා සැපයීම පහසු කිරීම සඳහා **රු. බිලියන** 28.7 (අධ්‍යාපනය සහ සෞඛ්‍ය හැර)
- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලි ඉදිකිරීම් නිම කිරීම සඳහා **රු. බිලියන** 2.26

## 2010-2023 කාලය තුළ රාජ්‍ය අංශයේ රැකියා වර්ධනය වන ආකාරය





## රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සඳහා වියදම්

**රු. බිලියන**




# වෘත්තිය අනුව ජාතික සහ පළාත් මට්ටමින් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව





*කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## විශ්‍රාම වැටුප් - විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව සහ විශ්‍රාම වැටුප් සඳහා වියදම් කාලයත් සමඟ වර්ධනය




*ජාතික අයවැය දෙපාර්තමේන්තුව*




*ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

# ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තනය ශක්තිමත් කිරීම

තොරතුරු හා සන්නිවේදන අංශයේ තාක්ෂණයේ වේගවත් පරිණාමය ආර්ථික හා සමාජීය ක්‍රියාකාරකම් විශාල වශයෙන් ප්‍රතිනිර්මාණය කර ඇතිවා පමණක් නොව අනෙකුත් සියලුම අංශවල ද විස්මිත වේගයකින් නව්‍යකරණයන් සිදු කරයි. ඩිජිටල්කරණය මූල්‍ය, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රවාහනය, නිෂ්පාදන ආදී විවිධ අංශ හරහා ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වල තීරණාත්මක බලවේගයක් බවට පත්ව ඇත. තාක්ෂණය වේගයෙන් දියුණුවන යුගයක, ඩිජිටල්කරණය යොදා ගැනීම හුදෙක් විකල්පයක් නොව රටේ ඉදිරි ගමනට සහ සංවර්ධනයට අත්‍යවශ්‍ය කරුණකි.

ශ්‍රී ලංකාව තුළ, ඩිජිටල්කරණය දැනටමත් බැංකු සහ මූල්‍ය, ඊ-වාණිජ්‍යය, පුද්ගලික සෞඛ්‍ය සේවා සහ විදුලි සංදේශ යන ක්ෂේත්‍ර කිහිපයක් සඳහාම බලපෑම් එල්ලකර ඇත. ඩිජිටල් විසඳුම් භාවිතා කිරීම ස්ථාවර ලෙස ඉහළ යන අතර අපගේ ඩිජිටල් යටිතල පහසුකම් හොඳින් සංවර්ධනය වී ඇත. 2022 වසර අවසන් වන විට අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව අපේ රටේ ජනගහණයට සමාන විය. බාධාවකින් තොරව 4ඨ ජංගම දුරකථන ආවරණය දිවයිනේ බොහෝ ප්‍රදේශවලට පුළුල් අන්තර්ජාල ප්‍රවේශයක් ද සපයයි.

එසේ වුවද, එවැනි සැලකිය යුතු ප්‍රගතියක් හමුවේ වුවද, ඩිජිටල් ආර්ථිකයක් ඇතුළු ඩිජිටල්කරණයේ පූර්ණ විභවය සාක්ෂාත් කර ගැනීම සඳහා ආවරණය කිරීමට බොහෝ කරුණු පවති. මෙම පරිවර්තනය වේගවත් කිරීම සඳහා රජය රාජ්‍ය අංශය ඩිජිටල්කරණය කිරීම දැනටමත් ආරම්භ කර ඇත. අපගේ මූලික අරමුණු පැහැදිලිය: රාජ්‍ය සේවා සැපයීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ (BPO) කර්මාන්තයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම එයින් ප්‍රධාන වේ. දත්ත ආරක්ෂාව, අදාළ යටිතල පහසුකම් සංවර්ධනය, සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ කුසලතා සංවර්ධනය ඇතුළු ප්‍රධාන ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කරමින් මෙම අරමුණු ඉටුකර ගනු ඇත.

මෙම ප්‍රයත්නයේදී, සියලු පුරවැසියන්ට සම්බන්ධතාව, ඩිජිටල් කුසලතා සහ තාක්ෂණය සඳහා සාධාරණ ප්‍රවේශයක් ඇති බව සහතික කරමින්, "ඩිජිටල් බෙදීම" සීමා කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරනු ඇත. දැනටමත් ලංකා රාජ්‍ය ජාලය (ඛඨභ) හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අමාත්‍යාංශ සහ තෝරාගත් දෙපාර්තමේන්තු සමූහයක් දක්වා දළ වශයෙන් රාජ්‍ය ආයතන 860ක් සම්බන්ධ කර ඇත. රාජ්‍ය ආයතන අතර ආරක්ෂිත දත්ත හුවමාරු කර ගැනීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ජාලය නුදුරු අනාගතයේ දී රාජ්‍ය ආයතන 1700ක් දක්වා ව්‍යාප්ත කිරීමට යෝජිතය.

එපමණක් නොව, රාජ්‍ය ආයතන 200ක් පමණ Lanka Cloud සිය සේවාදායකය ලෙස භාවිතා කර ඇත. මීට අමතරව, දැනටමත් බොහෝ රාජ්‍ය වියදම් සහ ආදායම් කළමනාකරණ පද්ධති ඩිජිටල්කරණය කර ඇති අතර එමගින් භූගෙ ෝලීය බාධාවන් ඉවත් කර ඇත 'මෙම පරිවර්තනය සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේම ස්ථානවලින් රාජ්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබා දෙයි, භෞතික සංචාරවල අවශ්‍යතාවය අඩු කරයි, සහ එසේ කිරීමෙන් කාලය සහ වටිනා සම්පත් යන දෙකම ඉතිරි වේ.

අප ඉදිරියට යන විට, අපගේ ජාතිය සවිබල ගන්වන ඩිජිටල් පද්ධතියක් ඇති කිරීමේ අපගේ කැපවීමෙහි අපි ස්ථිරව

සිටිමු . අපි එක්ව, ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය සඳහා ඩිජිටල් තාක්ෂණයේ අසීමිත විභවය දිගටම ප්‍රයෝජනයට ගනිමු. 2024 සඳහා අපගේ අයවැය මෙම ඩිජිටල් පරිවර්තනය ඉදිරියට ගෙන යාමට සැලසුම් කර ඇත.

2024 දී, උසස් තාක්ෂණය මත පදනම් වූ විසඳුම් උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ සේවා සැපයීම වේගවත් කිරීම සඳහා රුපියල් බිලියන 18 ක් වැය කිරීමට රජය අපේක්ෂා කරයි.

## 2024 අයවැය තුළ තොරතුරු තාක්ෂණයට අදාල සමස්ත අරමුණු:

1. ඒකාබද්ධ  ඩිජිටල් ආර්ථිකයකට සහ ඩිජිටල්කරණය වූ සේවා සැපයීමකට සංක්‍රමණය වීම
2. ආයෝජන සඳහා රජයේ පහසුකම් සපයන ඩිජිටල් ව්‍යාපාරික වේදිකාව (Platform)
3. වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා මානව කේන්ද්‍රීය තාක්ෂණය උපයෝගී කර ගැනීම.
4. ඩිජිටල් බෙදීම අඩු කිරීම සහ ඩිජිටල් පරිවර්තනය රටේ සෑම ප්‍රදේශයකටම ළඟා වන බව සහතික කිරීම

## ප්‍රධාන ක්ෂේත්‍ර

1 ඩිජිටල් යටිතල පහසුකම්

2. ඊ-රාජ්‍ය (e-Governance)

3. ඩිජිටල් සාක්ෂරතාවය සහ අධ්‍යාපනය.

4. තාක්ෂණික කර්මාන්ත සංවර්ධනය.

5. ඩිජිටල් සෞඛ්‍ය ආරක්ෂණය

6. සයිබර් ආරක්ෂාව.

7 ඩිජිටල්කරණය ව්‍යාප්ත කිරීම

# රජයේ ආයතන ඩිජිටල්කරණය සඳහා
# රු. බිලියන 18.0

## මූල්‍ය

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) – **රු. බිලියන 4.5**
- ASYCUDA IT පද්ධතිය නඩත්තු කිරීම - **රු. බිලියන 0.17**
- සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතිය (EDSL) – **රු. බිලියන 0.84**
- ඉ-රාජ්‍ය ප්‍රසම්පාදන ව්‍යාපෘතිය - **රු. බිලියන 0.42**
- ITMIS වැඩසටහන පුළුල් කිරීම - **රු. බිලියන 0.58**

## තාක්ෂණ

- රජයේ මෙහෙයුම් ඩිජිටල්කරණය (LGN,LGC ආදිය) **රු. බිලියන 1.9**
- දත්ත ආරක්ෂණ අධිකාරිය, කාර්යක්ෂම අධීක්ෂණ සහ නියාමන ක්‍රියාවලියක් හරහා මහජනතාවගේ තොරතුරු සුරක්ෂිත කිරීම - **රු. බිලියන 0.2**

## ප්‍රවාහන

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඊ-මෝටර් සහ මාර්ගගත පරීක්ෂණ - **රු. බිලියන 1.1**

## සෞඛ්‍යය

- රෝහල්වල ඩිජිටල් සෞඛ්‍ය තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම - **රු. බිලියන 0.20**
- වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධති ප්‍රාදේශීය රෝහල් දක්වා ව්‍යාප්ත කිරීම - **රු. බිලියන 0.095**

## අධ්‍යාපන

- ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් නඩත්තු කිරීමේ වැඩසටහන - **රු. බිලියන 0.12**
- ඊ-තක්සලාව - **රු. බිලියන 0.27**

## රාජ්‍ය පරිපාලනය

- ඊ-ග්‍රාම නිලධාරී මුලපිරීම් - **රු. බිලියන 1.25**
- ඊ-ඉඩම් සහ ඊ-ජනගහන ව්‍යාපෘති - **රු. බිලියන 0.18**
- පළාත් පාලන ආයතන සඳහා දත්ත පදනමක් ස්ථාපිත කිරීම - **රු. බිලියන 0.030**

## ඉඩම්

- රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slim) – **රු. බිලියන 0.045**
- ශ්‍රී ලංකාවේ ඉඩම් තොරතුරු සේවා පද්ධතිය - **රු. බිලියන 0.25**

## ආගමික

- ත්‍රිපිටකය" ඩිජිටල්කරණය ඇතුළු ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තු ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය - **රු. බිලියන 0.035**
- ලේඛනාරක්ෂණය සඳහා ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීම - **රු. බිලියන 0.12**

## අධිකරණ

- බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය - **රු. බිලියන 0.050**

## මහජන ආරක්ෂාව

- ඊ-ජාතික හැඳුනුම්පත - **රු. බිලියන 3.0**

## කම්කරු

- ඵලදායී සේවා සැපයීම සඳහා EPF තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම - **රු. බිලියන 0.1**

# සමාජ ආරක්ෂණය

## රු. බිලියන 714

### අස්වැසුම වැඩසටහන - රු. බිලියන 200.0

- අඩු ආදායම් පවුල් සඳහා මුදල් ආධාර - **රු. බිලියන 183.3**
- ආබාධිත පුද්ගලයින් සඳහා සහාය - **රු. බිලියන 4.3**
- වැඩිහිටි (වයස අවුරුදු 70 ට වැඩි) සඳහා මූල්‍ය ආධාර - **රු. බිලියන 10.0**
- වැඩිහිටි (වයස අවුරුදු 100 ට වැඩි) සඳහා මූල්‍ය ආධාර - **රු. බිලියන 0.03**
- වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර - **රු. බිලියන 2.3**

### විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික

- රාජ්‍ය නිලධාරීන් සඳහා විශ්‍රාම (විශ්‍රාමිකයින් 730,000) - **රු. බිලියන 270.0**
- මියගිය සහ තුවාල ලැබූ සොල්දාදුවන් සඳහා සේවා වන්දි (සොල්දාදුවන් 41,800) - **රු. බිලියන 44.5**
- රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුරු/ වැන්දඹු පුරුෂ සහ අනත්දරු සඳහා විශ්‍රාම වැටුප් - **රු. බිලියන 68.0**
- පාරිතෝෂිත ගෙවීම් - **රු. බිලියන 47.0**
- විශ්‍රාමිකයින් සඳහා අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර - **රු. බිලියන 0.42**

### අනෙකුත් සුබසාධන / සහනාධාර

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොලී වෙනස ගෙවීම - **රු. බිලියන 20.0**
- ලෝක ආහාර වැඩසටහන - **රු. බිලියන 1.8**
- සමෘද්ධි අරමුදල් ප්‍රතිපූරණය - **රු. බිලියන 36.0**
- ප්‍රජී වර්ජකයන් සඳහා සහන - **රු. බිලියන 0.012**

- සමාජ සංවර්ධන වැඩසටහන සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම - **රු. බිලියන 26.6**

# ගිණුම්කරණ ආකෘතියට අනුව 2024 අයවැය

රු. බිලියන

| | | 2024 ඇස්තමේන්තුව |
|---|---|---|
| 1 | **පුනරාවර්තන** | 5,354 |
| | පුද්ගල වැටුප් පඩිනඩි හා දීමනා | 1,145 |
| | පොලී ගෙවීම | 2,651 |
| | සහනාධාර සහ සංක්‍රාම | 1,065 |
| | වෙනත් පුනරාවර්තන | 493 |
| | | |
| 2 | **ප්‍රාග්ධන** | 1,205 |
| | දේශීය අරමුදල් සහිත ව්‍යාපෘති | 380 |
| | විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘති | 625 |
| | සංවර්ධන සහනාධාර | 42 |
| | ප්‍රතිව්‍යුහගත කිරීම / කොටස් දායකත්වය | 70 |
| | වෙනත් ප්‍රාග්ධන | 88 |
| | | |
| 3 | **ණය සේවාකරණය** | 1,268 |
| | දේශීය | 994 |
| | විදේශීය | 274 |
| | | |
| 4 | **අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරකම්** | 6 |
| | **මුළු එකතුව** | 7,833 |

# සුබසාධක ප්‍රතිලාභ

## 1. සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන



අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය ආධාර ලබා දීම මෙන්ම වැඩිහිටියන්ට, විශේෂ හැකියාවන් සහිත පුද්ගලයන්ට සහ වකුගඩු රෝගීන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා රුපියල් මිලියන 200,000 ක් 2024 ඇස්තමේන්තු මගින් වෙන් කර ඇත. අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන යටතේ හඳුනා ගන්නා ලද ප්‍රතිලාභීන් හට සිය බැංකු ගිණුම් වෙත සෘජුවම මුදල් ප්‍රේෂණය කිරීම මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. අඩු ආදායම්ලාභි පවුල් 2,000,000 ක ප්‍රමාණයකට සහන සැලසීමට අපේක්ෂා කෙරේ.




## 2. අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීම

අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහන තුළින් සියළුම ප්‍රතිලාභි පවුල් වසර 3 ක් ඇතුළත ආර්ථික, මානසික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමට අදහස් කරනු ලබයි. මෙම වැඩසටහනෙහි නියමු ව්‍යාපෘතියක් ලෙස ඉදිරි වසරෙහි සුභසාධක ප්‍රතිලාභ වැඩසටහන තුළින් ඉවත්ව යන සංක්‍රාන්තික හා අවදානමට ලක්වූ පවුල් කාණ්ඩයම් සවිබලගැන්වීමට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 1,050 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

## 3. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන



ප්‍රාදේශීයව පවතින නිෂ්පාදන විශේෂතා හඳුනාගනිමින් ඒවා නිෂ්පාදන ගම්මාන ලෙස සංවිධානය කර දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගත් නිෂ්පාදන මගින් එම ප්‍රදේශවල ජීවත්වන අයගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමට මෙම වැඩසටහන යටතේ රජය විසින් පහසුකම් සලසා දෙනු ලැබේ. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි දැනටමත් ආරම්භ කර ඇති නිෂ්පාදන ගම්මානවලට පහසුකම් සැලසීම සඳහා 2024 වර්ෂය තුළ රුපියල් මිලියන 150 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.



## 4. විශ්‍රාම වැටුප් ගෙවීම

විශ්‍රාමික රාජ්‍ය සේවකයින් 730,000 කට අධික පිරිසක් සඳහා මාසික විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සහ මියගිය රාජ්‍ය සේවකයන්ගේ යැපෙන්නන්ට රාජ්‍ය සේවකයා සේවයේ යෙදී සිටියදී කරන ලද දායකත්වය හේතුවෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම වෙනුවෙන් 2024 වර්ෂයේදී රුපියල් මිලියන 385,458 ක් වෙන් කර ඇත

## 5. රණවිරු මාපිය රැකවරණ දීමනාව ලබාදීමේ වැඩසටහන



යුද්ධය හේතුවෙන් දිවි අහිමි වූ රණවිරුවන්ගේ දෙමාපියන් 253,333 ක් සඳහා රු. 750 බැගින් මාසික දීමනාවක් ගෙවීම වෙනුවෙන් 2024 වර්ෂයේදී රුපියල් මිලියන 2,280 ක් වෙන්කර ඇත.



## 6. ආබාධිත වූ රණවිරුවන් වෙනුවෙන් සේවා වන්දි ගෙවීම

ත්‍රස්ත ක්‍රියාන්විතයේ දී ආබාධිත වූ ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයන්ට සහ මිය ගිය රණවිරුවන් වෙනුවෙන් ඔවුන්ගේ යැපෙන්නන්ට හිමි වන සේ, ප්‍රතිලාභීන් 41,800 ක් සඳහා සේවා වන්දි ගෙවීම වෙනුවෙන් 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 44,500 ක් වෙන් කර ඇත.

## 7. විවිධ හැකියාවන් ඇති සිසුන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන



විවිධ හැකියාවන් සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම හා කුසලතා සංවර්ධනය තුලින් ඔවුන් ආර්ථික සංවර්ධනයේ කොටස් කරුවන් ලෙස සමාජ ගත කිරීමේ අරමුණින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සිංහල භාෂා මාධ්‍ය වෘත්තීය පුහුණු ආයතන 08 ක, දමිළ භාෂා මාධ්‍ය පුහුණු ආයතන 02 ක හා ඉංග්‍රිසි මාධ්‍ය පුහුණු ආයතන 01 ක යටිතල පහසුකම් සංවර්ධනය සදහා 2024 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 35 ක් වෙන් කර ඇත.

# සෞඛ්‍ය පහසුකම් සැලසීම

## 8. රජයේ රෝහල් සඳහා ඖෂධ සැපයීම



ආසන්න දත්ත අනුව, වාර්ෂිකව බාහිර රෝගීන් මිලියන 40 කට හා නේවාසික රෝගීන් මිලියන 6 කට ආසන්න ප්‍රමාණයක් රජයේ රෝහල් මගින් නිදහස් සෞඛ්‍ය සේවා පහසුකම් සලසා ගනු ලබයි.

දිවයින පුරා පිහිටි රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන 1,300 කට ආසන්න ප්‍රමාණයක් මගින් සලසා දෙනු ලබන රෝගී ප්‍රතිකාර සේවා සඳහා අවශ්‍ය වන ඖෂධ සහ වෛද්‍ය සැපයීම් වෙනුවෙන් රුපියල් මිලියන 180,300 ක් 2024 ඇස්තමේන්තුව මගින් වෙන්කර තිබේ.

## 9. 1990 - සුවසැරිය නොමිලේ ගිලන්රථ සේවාව




පැය 24 පුරා ක්‍රියාත්මක වන 1990 සුවසැරිය ගිලන්රථ සේවාව මගින් වසරකදී රෝගීන් 350,000 කට පමණ සේවා සැපයීම සිදු කරනු ලබයි. හදිසි අනතුරු හා රෝගාතුර වන පුද්ගලයින් ආසන්නතම රෝහල කරා රැගෙනයාම එමගින් සිදු කරයි. 2024 වසරේ මෙම සේවා තවදුරටත් පුළුල් කරමින් පවත්වා ගෙන යාම සඳහා රුපියල් මිලියන 4,400 ක ප්‍රතිපාදන වෙන්කර තිබේ.

## 10. ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන



මාතෘ සායන වල ලියාපදිංචි වන සෑම ගර්භණී මවකටම ගර්භණී සමය තුළදී මාස 06ක් ද කිරි දෙන සමයේදී මාස 04 ක් ද වන සේ පෝෂ්‍ය පදාර්ථ සහිත ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මාසිකව රුපියල් 2,000ක් වටිනා වවුචර පත් 10 ක් ලබා දුන් අතර එය 2023 වර්ෂයේ සිට මාසිකව රුපියල් 4,500ක වටිනාකමින් යුත් වවුචර පත් 10ක් ලෙස රුපියල් 45,000 දක්වා වැඩිකර ඇත. මෙම දීමනාව ගෙවීමට 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 10,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

## 11. ත්‍රිපෝෂ වැඩසටහන




පෝෂණ ගුණයෙන් ඉතා ඉහළ අතිරේක ආහාරයක් වන ත්‍රිපෝෂ, සියලු ම ගර්භනී මව්වරුන්, ළදරුවාට මාස 06 ගතවන තුරු සියලු ම කිරිදෙන මව්වරුන්, මන්ද පෝෂණයෙන් පෙළෙන මාස 06 ත් අවුරුදු 05ත් අතර දරුවන් (බර අනුව ළමා කාඩ්පතේ -2SD රේඛාවට පහළින් සිටින ළමුන්, ළමා වර්ධක සටහනට අනුව මාස 03ක කාලයක් තුළ ශීඝ්‍ර බර අඩු වීමක් පෙන්නුම් කරන ළමුන්) හා ඉහත කී කණ්ඩායම් වලට අයත් වාට්ටු ගත රෝගීන් සඳහා මසකට ග්‍රෑම් 750 පැකැට් 02 බැගින් නොමිලේ බෙදා හරිනු ලැබේ. ත්‍රිපෝෂ වැඩසටහන වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 9,000 ක් වෙන් කර ඇත.

## 12. පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වැඩසටහන




පෝෂණ ඌණතාවයෙන් පෙලෙන පෙර පාසල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමේ මූලික අරමුණ පෙරදැරිව පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කෙරේ. දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි පෙර පාසල් දරුවන් 155,000කට ( වතු ආශ්‍රිත පෙර පාසල් දරුවන් 35,000ක්ද ඇතුළුව) ආසන්න පිරිසකට ප්‍රතිලාභ ලබා දීම සඳහා විශේෂ අවධානය යොමු කරනු ලැබේ. 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 2,102 ක ප්‍රතිපාදන මෙම වැඩසටහන සඳහා වෙන්කර ඇත.



# අධ්‍යාපන පහසුකම් සැලසීම

## 13. පාසල් පෙළ පොත් ලබාදීම



රජයේ සහ රජයේ ආධාර ලබන පාසල් සිසුන් හා පිරිවෙන් සිසුන් ඇතුළු මිලියන 4.2 කට ආසන්න ශිෂ්‍ය ප්‍රජාව වෙත වාර්ෂිකව පෙළ පොත් රජය මගින් නොමිලේ ලබා දීමට කටයුතු කෙරේ. ඒ අනුව, පාසල් පෙළ පොත් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 20,000 ක් 2024 වර්ෂයේදී වෙන්කර ඇත.



## 14. පාසල් නිල ඇඳුම් ලබාදීම

රජයේ සහ රජයේ ආධාර ලබන පාසල් සිසුන් හා පිරිවෙන් සිසුන් ඇතුළු මිලියන 4.5 කට ආසන්න ශිෂ්‍ය ප්‍රජාව වෙත වාර්ෂිකව නිල ඇඳුම් රජය මගින් නොමිලේ ලබා දීමට කටයුතු කෙරේ. ඒ අනුව, පාසල් නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් රුපියල් මිලියන 6,000 ක ප්‍රතිපාදනයක් 2024 වර්ෂයේදී වෙන්කර ඇත.

## 15. පාසල් සිසුන් සඳහා පාවහන් ලබා දීම




දුෂ්කර, අති දුෂ්කර හා හුදෙකලා පාසල් වල දැනට හඳුනාගෙන ඇති 750,000 පමණ වන ශිෂ්‍යයින්, පිරිවෙන් භික්ෂූන් වහන්සේලා හා සීලමාතා ආරාමයන්හි සීල මාතාවන් සඳහා පාවහන් මිලදී ගැනීමට තිළිණ පත් ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුවේ. ඒ සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 2,540 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

## 16. සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන




සියලුම රජයේ පාසල්, උපකෘත පාසල් හා පිරිවෙන් අධ්‍යාපනය ලබන සියළුම ශ්‍රී ලාංකික ගිහි-පැවිදි සිසුන් ආවරණය වන සේ “සුරක්ෂා” සිසු රක්ෂණාවරණය ක්‍රියාත්මක කෙරේ. මෙමගින් රෝහල්ගතවීම, වෛද්‍ය පරීක්ෂණ යනාදිය සඳහා මුදල් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. සිසුන් 600,000 කට පමණ වාර්ෂිකව මෙම ප්‍රතිලාභය හිමි වන අතර 2024 සඳහා රුපියල් මිලියන 2,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබේ.



## 17. 5 ශ්‍රේණියේ සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන

අඩු ආදායම්ලාභී පවුල්වල ඉගෙනීමෙහි දක්ෂතා දක්වන දරුවන් සඳහා සහායක් ලෙස වාර්ෂිකව සිසුන් 20,000 ක් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල මත තෝරා ගැනෙන අතර විශේෂ අවශ්‍යතා සහිත සිසුන් 250 දෙනෙකු ඊට ඇතුළත් වේ. අ.පො.ස. (උ.පෙළ) දක්වා රුපියල් 750 ක මුදලක් මාසිකව ගෙවීම් කරනු ලබයි. ඒ අනුව, 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යත්වලාභීන් 135,000 ක් වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 938 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

## 18. උසස්පෙළ තාක්ෂණ විෂයධාරාව හදාරන සිසුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම





නව තාක්ෂණ විෂය ධාරාවන් හරහා අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපනය සඳහා යොමු වන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අඛණ්ඩව අධ්‍යයන කටයුතු සිදු කර ගෙන යාම සඳහා තාක්ෂණ විෂය ධාරාව පවතින පාසැල්වල සිසුන් සඳහා මසකට රුපියල් 750/- බැගින් ගෙවීම් කරනු ලබන අතර, මේ සඳහා 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 10.5 ක ප්‍රතිපාදනයක් වාර්ෂික අයවැය මගින් වෙන් කර ඇත.

මෙයට අමතරව සුජාත දියණිය ශිෂ්‍යත්ව වැඩසටහන මගින් උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාවන් හදාරනු ලබන අඩු ආදායම්ලාභී පවුල්වල සිසුවියන්ගේ මූල්‍යමය දුෂ්කරතා මග හැරවීම පිණිස සිසුවියන් 250 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර දීමනා ලබා දෙනු ලැබේ. මසකට රුපියල් 750/- බැගින් ගෙවීම් කරනු ලබන අතර 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 3.75 ක ප්‍රතිපාදන වාර්ෂික අයවැය මගින් වෙන් කර ඇත.



## 19. මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර වැඩසටහන

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට උසස් අධ්‍යාපනය සඳහා මහපොළ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ රුපියල් 5,000 ක මාසික දීමනාවක් ලබා දෙනු ලැබේ. එමගින්, ශිෂ්‍යත්වලාභීන් 64,000 කට ආසන්න සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසේ. මහපොළ ශිෂ්‍යත්ව ලබාදීමට එම අරමුදලේ දායකත්වයට අමතරව රජය විසින් ද දායකත්වය ලබා දෙයි.

මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමයට සමගාමී ව විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍ය සහාය ලබා දීමේ ශිෂ්‍යාධාර වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා වැය වන සම්පූර්ණ වියදම රජය විසින් දරනු ලැබේ. ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ ශිෂ්‍යත්වලාභීන් 36,000 කට ආසන්න සංඛ්‍යාවකට මාසිකව රුපියල් 4,000 බැගින් ලබා දෙනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂයේදී සිසුන් 100,000 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා මහපොළ හා ශිෂ්‍යාධාර ලබාදීමට රුපියල් මිලියන 2,500 ක ප්‍රතිපාදනයක් 2024 වර්ෂයේ වෙන්කර ඇත.

## 20. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීමට සිසුන් වෙත ලබාදෙන පොලී රහිත ණය යෝජනා ක්‍රමය



අ.පො.ස. (උ/පෙළ) සමත්ව රාජ්‍ය විශ්ව විද්‍යාලයකට ඇතුලත්වීමට පහසුකම් නොලබන සිසුන් සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීමට රුපියල් 800,000ක පොලී රහිත ණය යෝජනා ක්‍රමයක්, උසස් අධ්‍යාපන ආයතන සමග එක්ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මේ වන විට ණය ලබාදී ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 18,000 ක් වන අතර 2024 වර්ෂයේ මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර ඇත. මෙයට අමතරව සිසුන්ගේ අමතර වියදම් දැරීම වෙනුවෙන් තවත් රුපියල් 300,000 ක පොලී රහිත ශිෂ්‍ය ණය මුදලක් ලබා ගැනීම සඳහා ද අවස්ථාව සලසා දී තිබේ.



## 21. පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනාව (ගුරු අභිමානී)

පෙර පාසල් ගුරුවරුන් මානව සම්පත් සංවර්ධනයේ ප්‍රධාන පාර්ශවයක් ලෙස හඳුනාගනිමින් පෙර පාසල් ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ඔවුන්ගේ සේවය ඇගයීම පිණිස පෙර පාසල් ගුරුවරුන් 18,000 ක් සඳහා මාසිකව රුපියල් 2,500 ක් වූ “ගුරු අභිමානී” දීමනාව ගෙවීමට රුපියල් මිලියන 550 ක් 2024 වර්ෂයේ වෙන් කර ඇත.

## 22. පාසල් පෝෂණ වැඩසටහන



නිරෝගී ක්‍රියාශීලී දරු පරපුරක් යන තේමාව යටතේ  පාසල් සිසුන් අතර පෝෂණ ගැටලු අවම කිරීම, දෛනික පාසල් පැමිණීම වර්ධනය කිරීම, යහපත් ආහාර පුරුදු හා සෞඛ්‍ය පුරුදු වර්ධනය කිරීම හා දේශීය ආහාර සංස්කෘතියක් ගොඩනැගීම තුළින් රටට වැඩදායී පුද්ගලයෙකු බිහි කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.

ඒ අනුව තෝරා ගත් පාසල්වල 1ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පාසල් සිසු දරුවන් 1,082,000 ක් සඳහා දිවා ආහාරය ලබා දීමට 2024 අයවැය ඇස්තමේන්තු මඟින් රු. මිලියන 16,700 ක් වෙන් කර ඇත.



## 23. දහම් පාසැල් ගුරුවරුන් වෙත සහන සැලසීම

දහම් පාසල්වල දීර්ඝ කාලයක් පුරා නිස්සරණධ්‍යාසයෙන් සේවය සලසන ගුරුවරුන්ගේ සේවය ඇගයීමක් ලෙස බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි දහම් පාසල් වල සේවය කරන ගුරුවරුන් 125,000 කට අධික ප්‍රමාණයක් සඳහා රුපියල් 5,000 බැගින් දීමනාවක් ලබාදීමට 2024 අයවැය මගින් රුපියල් මිලියන 635 ක් වෙන්කර ඇත.

## 24. වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා නිපුණතා සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩ සටහන



ආර්ථිකමය වශයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල පාසැල් හැරගිය දරුවන් 65,300 ක් සඳහා වෘත්තීය අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 700 ක ප්‍රතිපාදන වෙන්කර ඇත.



# කෘෂිකර්ම හා වැවිලි සහනාධාර

## 25. තේ වගා සහනාධාරය




නැවත වගා කිරීම හෝ නව වගා සඳහා යොමු වූ ගොවීන්ගේ ආදායම් තහවුරු වන තෙක් තේ සහනාධාර වැඩසටහන යටතේ නැවත වගා සඳහා හෙක්ටයාරයකට රු. 750,000 ක් හා නව වගාව සඳහා හෙක්ටයාරයකට රුපියල් 500,000 ක් වශයෙන් සහනාධාරයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ලබා දේ. මෙම වැඩසටහන යටතේ සහනාධාර ලබා දීම සඳහා 2024 වර්ෂයේ රජයේ දායකත්වය ලෙස රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත.



## 26. රබර් වගාව හා ආශ්‍රිත කර්මාන්ත සඳහා සහනාධාර

රබර් වගාව සඳහා ව්‍යාප්ති සේවා ලබා දීමට අමතරව, රබර් නැවත වගාව, නව වගාව, වැසි ආවරණ යෙදීම හා අතුරු භෝග සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත.

## 27. පොල් වගා සහනාධාර



පොල් වගාව දිරිමත් කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ උසස් තත්ත්වයෙන් යුත් පොල් පැළ ලබා දීම, පොහොර සහනාධාර ලබා දීම, වගාබිම් සකස් කිරීමට සහාය ලබා දීම, සහන ණය ලබා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත.



## 28. සාම්ප්‍රදායික නොවන අපනයන භෝග සහනාධාරය

වැනිලා, ගම්මිරිස්, කෝපි, කරාබුනැටි, සාදික්කා, කොකෝවා වැනි සුළු අපනයන භෝග ප්‍රවර්ධනය සඳහා උසස් තත්ත්වයේ සහතික කරන ලද පැළ සහන මිලට ලබාදීම, ව්‍යවසායක ආධාර ලබා දීම, ව්‍යාප්ති සේවා ලබා දීම වැනි සහනාධාර වැඩසටහන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 400 ක් වෙන් කර ඇත.

## 29. පොහොර සහනාධාරය



වී නිෂ්පාදනයේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම, කෘෂිකර්මාන්තය වෙනුවෙන් වන යෙදවුම් සහන මිලකට සැපයීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. වර්තමානයේ දී මෙම සහනාධාරය මූල්‍යමය ආධාරයක් වශයෙන් ගොවීන් වෙත සෘජුව ලබා දීමට රජය විසින් තීරණය කර ඇති අතර, යල සහ මහ කන්නවල වී වගා කරන උපරිම හෙක්ටයාර දෙකක් වෙනුවෙන් 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් රුපියල් මිලියන 19,500 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබේ.

## 30. කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය



වී, බඩ ඉරිඟු, අර්තාපල්, මිරිස්, ලොකු ළූණු හා සෝයා බෝංචි යන බෝග වගාවන්ට සිදුවන හානිපූර්ණය වෙනුවෙන් වූ දායකත්ව කෘෂිරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වී වගාව සඳහා උපරිම වශයෙන් හෙක්ටයාර දෙකක් ද අනෙකුත් බෝග වර්ග සඳහා උපරිම වශයෙන් හෙක්ටයාර එකක් ද වශයෙන් සලකා අක්කරයකට රුපියල් 40,000ක වගා හානි පූර්ණයක් මෙම යෝජනා ක්‍රමය යටතේ සලසනු ලැබේ. මෙම වගා හානි වැඩසටහනෙහි සම්පූර්ණ පිරිවැය රජය විසින් දරමින් මේ වන විට ක්‍රියාත්මක වේ. 2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් රුපියල් මිලියන 1,000 ක මුදලක් වෙන් කර ඇත.



# ප්‍රවාහන සේවා

## 31. සහනදායි ගමන් වාරප්‍රවේශපත්‍ර



පාසල්, උසස් අධ්‍යාපන, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සිසුන් සඳහා ගමන් වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම වෙනුවෙන් රුපියල් මිලියන 10,500 ක් 2024 අයවැය මගින් වෙන්කර තිබේ. මේ යටතේ, පාසැල් සිසුන් 487,000 ක් උසස් අධ්‍යාපන සිසුන් 7,000 වෘත්තීය අධ්‍යාපන හා කාර්මික සිසුන් 31,000 කට පමණ සහන හිමි වේ.

## 32. ප්‍රවාහන පහසුකම් සඳහා ශ්‍රී ලංගම වෙත සහන සැලසීම




ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ගමන් පහසුකම් සැලසීම සඳහා ආර්ථික වශයෙන් ලාභදායී නොවන මාර්ගවල ලංගම බස් රථ ධාවනය වෙනුවෙන් රජය විසින් ලංගම වෙත රුපියල් මිලියන 2,000 ක් ද සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය යන බස් සේවාවන් පවත්වාගෙන යාම සඳහා රුපියල් මිලියන 2,000 ක් ද වශයෙන් 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

# ක්‍රීඩා සඳහා සහන

## 33. ක්‍රීඩකයින්ට හා යෞවනයින්ට පහසුකම් සැලසීම




උසස් දක්ෂතා පෙන්නුම් කරන හා ජාතික ක්‍රීඩා පුහුණු සංචිතයේ සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණය නඟා සිටුවීම හා නේවාසික පහසුකම් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 277 ක් ද, ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර් ජාතික තරඟවලට සහභාගී වීමට සහ ඒ සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් රුපියල් මිලියන 100 ක් ද තරුණ පරපුර කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධනය සඳහා නොමිලයේ පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් රුපියල් මිලියන 2,677 ක් ද 2024 වර්ෂය සඳහා වෙන් කර ඇත.

# කලාකරුවන්, ලේඛකයන් හා සංස්කාරකවරු සඳහා සහන සැලසීම

## 34. කලාකරුවන් සඳහා ආධාර ලබාදීමේ වැඩසටහන



කලා ක්ෂේත්‍රයට දායක වෙමින් සිදුකරන ලද සේවාව අගයනු වස්, තෝරා ගත් කලාකරුවන් වෙත වෛද්‍ය ආධාර ලබා දීම වැනි සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2024 වර්ෂයේ රුපියල් මිලියන 48 ක් වෙන් කර ඇත.



## 35. ලේඛකයන් හා සංස්කාරකවරුන් සඳහා පහසුකම් සැලසීම

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම විවිධ විෂයයන් යටතේ මුද්‍රණය කරනු ලැබූ, ග්‍රන්ථ ප්‍රකාශයට පත් කරන ලේඛකයන් හා සංස්කාරකවරුන් දිරිගැන්වීම හා පොත් අලෙවි කර ගැනීමට රුකුලක් ලබාදීම අරමුණු කර ඔවුන්ගේ ප්‍රකාශන මිලදී ගැනීම මෙම වැඩසටහන හරහා සිදු කෙරේ. මෙසේ ලබාගන්නා පොත් දිවයිනේ පාසල් හා පුස්තකාල සඳහා නොමිලයේ බෙදාහරිනු ලබයි. මේ සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 5 ක් වෙන් කර ඇත.

## 36. සාම්ප්‍රදායික කලායතන සඳහා ආධාර ලබාදීමේ වැඩසටහන

සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතන අධිශ්‍රේණියේ, විශිෂ්ට ශ්‍රේණියේ, හා සාමාන්‍ය ශ්‍රේණියේ කලායතන ලෙස වර්ගීකරණය කර එම සාම්ප්‍රදායික කලායතන දිරිගැන්වීම සඳහා 2024 වර්ෂයේ රුපියල් මිලියන 6 ක් වෙන් කර ඇත.





# සංවර්ධන සහායන්

## 37. කාන්තා ව්‍යවසායකයින් දිරි ගැන්වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනාක්‍රමය යටතේ කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ප්‍රදානය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 174 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.






## 38. රාජ්‍ය සේවකයන්ගේ දේපල ණය සඳහා වන පොලී සහනාධාරය

රාජ්‍ය සේවකයින්ගේ දේපළ ණය සහන පොලී අනුපාතයක් යටතේ රජයේ බැංකු මගින් සලසා දෙනු ලබන අතර, එම සේවකයින් වෙනුවෙන් සහන පොලී මුදල රජය විසින් බැංකු වෙත ගෙවීම් කරනු ලබයි. එම සහනය වෙනුවෙන් රුපියල් මිලියන 2,521 ක ප්‍රතිපාදන 2024 ඇස්තමේන්තු මගින් වෙන් කර ඇත.

## 39. වතු ආශ්‍රිත ප්‍රජාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සැලසීම



වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව වෙත නිවාස සහ ඒ සඳහා වන යටිතල පහසුකම් ලබාදීම මේ වනවිටත් ආරම්භ කර ඇත. මෙම නිවාස වැඩසටහන කඩිනමින් අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 4,625 ක් 2024 අයවැය වර්ෂය සඳහා වෙන් කර ඇත.



## 40. නාගරික අඩු ආදායම්ලාභී නිවාස

පෑලියගොඩ, දෙමටගොඩ, මහරගම, මොරටුව, කොට්ටාව යන ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස පහසුකම් සලසා දීම වෙනුවෙන් 2024 අයවැය ඇස්තමේන්තු මගින් රුපියල් මිලියන 3,200 ක් වෙන් කර ඇත.

## 41. නැවත පදිංචි කිරීම් සඳහා නිවාස ලබා දීම



උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති ගැටුම්වලින් නිවාස අහිමි වූවන් වෙත එම පළාත් වල නිවාස ඒකක 6,759 ක් ඉදිකිරීම ආරම්භ කර ඇත. ඒ සඳහා රුපියල් මිලියන 2,000 ක් 2024 වර්ෂය සඳහා වෙන් කර ඇත.



## 42. සැමට නිවාස වැඩසටහන

ග්‍රාමීය හා නාගරික අඩු ආදායම්ලාභී පවුල් වෙත නිවාස ඒකක 18,528 ක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර, එම වැඩසටහනේ තවදුරටත් කටයුතු අවසන් කර ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු නිවාස ඒකක 1,671 ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2,000 ක් වෙන් කර ඇත.

**CITIZENS BUDGET 2024**
**FOR WAHT, FOR WHOM**

Ministry of Finance, Economic Stabilization
and National Policies

The Secretariat, Colombo 01,
Sri Lanka.

**Phone :**
+94 112 484 600
+94 112 484 500
+94 112 484 700

**Fax :**
+94 112 449 823

**Email :**
info@mo.treasury.gov.lk